මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

மனிதவலு மற்றும் வேலைவாய்ப்புத் திணைக்களம

**Department of Manpower and Employment**





# කාර්යසාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# Performance Report 2019

**Department of Manpower and Employment**
**9 th Floor, Sethsiripaya 2nd Stage,**
**Battaramulla.**

# 2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

# වැය ශීර්ෂ අංකය - 328

# පටුන

පිටු අංකය


**1. පරිච්ඡේද 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සරාංශය**

1.1 හැඳින්වීම 4

1.2 අපගේ දැක්ම, මෙහෙවර හා අරමුණු 5

1.3 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් 6

1.4 සංවිධාන සටහන 7

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ සහ කාර්ය භාරය 8 -30

1.6 විදේශ අධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 30

**2. පරිච්ඡේද 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

2.1 ප්‍රගතිය 32 -39

2.2 අභියෝග හා ඉදිරි ඉලක්ක 40

**3. පරිච්ඡේද 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 42-43

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 44

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 45 -46

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 47

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 47

3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 47

3.7 මු.රෙ 208 ප්‍රකාරව ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 48

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 48

3.9 විගණකාධිපතිගේ වාර්තාව 49

**4. පරිච්ඡේදය 04 -කාර්ය සාධන දර්ශක**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය 51

**5. පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු 53 -55

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 55

**6. පරිච්ඡේදය 06 -මානව සම්පත් පැතිකඩ**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 57

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම 57 -58

6.3 මානව සම්පත් සංවර්ධනය 59-60

6.4 ආයතනයේ කාර්ය සාධනය සඳහා පුහුණු වැඩසටහන්හි දායකත්වය 61

**7. පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව** 63 – 67

ඇමුණුම්

# පරිච්ඡේදය 01

# ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

# 1. හැඳින්වීම

## 1.1 මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

2010.02.12 දිනැති අංක 1640/31 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව 2010 වර්ෂයේදී කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලද අතර වර්තමානයේ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. A ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කරන ලද මෙම දෙපාර්තමේන්තුව සඳහා රැකියා නියුක්තිය ප්‍රවර්ධනය කිරීම, රැකියා සැලසුම්කරණය ,රැකියා නියුක්තිය හා ශ්‍රම වෙළඳපොළ තොරතුරු , වෘත්තිය මාර්ගෝපදේශ වැඩසටහන් , යළි රැකියා නියුක්තිය සඳහා පුහුණු යන විෂයන් නිශ්චය කරනු ලැබිණ. මීට අමතරව දෙපාර්තමේන්තුව වෙත රාජ්‍ය රැකියා සේවාවන් පවත්වාගෙන යාම හා ජාතික මානව සම්පත් හා රැකියා සේවා නියුක්ති ප්‍රතිපත්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම ද පැවරී ඇත.

මෙම දෙපාර්තමේන්තුව මඟින් මේ දක්වා ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය මගින් පවත්වනු ලබන සමීක්ෂණ උපයෝගී කර ගනිමින් වෘත්තීය මාර්ගෝපදේශනයට හා රැකියා නිර්මාණ ප්‍රවර්ධනයට අදාළව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් රාශියක් සිදු කර ඇති අතර එමගින් ප්‍රතිලාභින් විශාල සංඛ්‍යාවකට ප්‍රතිලාභ ලබා දෙමින් හා රැකියා කේන්ද්‍රය හරහා මෙරට ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා රැකියා විරහිත තරුණ තරුණියන් හට පෞද්ගලික අංශයේ රැකියා ලබා දීම ද සිදු කරනු ලැබේ. ඒ අනුව අපගේ දීර්ඝ කාලීන ඉලක්ක පහත පරිදි වේ.

1. ගෝලීය වශයෙන් තරඟකාරී , නිපුණතාවයෙන් සහ බහුවිධ කුසලතාවයෙන් යුත් ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් ගොඩ නැංවීම
2. විරැකියාව අවම කිරීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම
3. සංවිධිත පරිපූර්ණ ශ්‍රම වෙළඳපල තොරතුරු පද්ධතියක් ඇති කිරීම

## 1.2 අපගේ දැක්ම හා මෙහෙවර හා අරමුණු

දැක්ම

ලෝක මට්ටමේ ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්

මෙහෙවර

පුළුල් නිපුණතාවයෙන් යුත්, ක්‍රියාශීලී සහ ගෝලීය වශයෙන් තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩනැගීම සහ අපේ මානව සම්පත්වල මුළු ශක්තිය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගැනීම

### අපගේ අරමුණු

1. ජාතික මානව සම්පත් හා සේවානියුක්ති ප්‍රතිපත්තිය සකස් කර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
2. කුසලතා නොගැලපීම යන ව්‍යුහාත්මක සේවා වියුක්ති ගැටළුව විසඳීම
3. වර්තමාන ශ්‍රම බලකායට අයත් සහ අනාගතයේ ශ්‍රම වෙළඳපොළට එක්වීමට නියමිත සියලුම ශ්‍රී ලාංකිකයන් හට නිවැරදි වෘත්තීය දිශානතිය නිශ්චය කරගැනීම සඳහා පහසුකම් සැලසීම.
4. මිනිස්බල සැලසුම් කිරීම.සංවර්ධනය හා පුරෝකථනය
5. අවිධිමත් අංශය සංවර්ධනය
6. පෞද්ගලික අංශයේ රැකියා සඳහා රැකියා අපේක්ෂකයින් පෙළඹවීම
7. නිදහස් මහජන රැකියා සේවය ලබාදීම
8. අවධානමට ලක් වූ කණ්ඩායම්, ආබාධිත පුද්ගලයන් හා ඌන සංවර්ධිත ප්‍රදේශවල වෙසෙන පුද්ගලයන් සඳහා මිනිස්බල හා සේවා නියුක්තිය ආශ්‍රිත පහසුකම් සැපයීම
9. ගෝලීය හා දේශීය වශයෙන් නිවැරදි ශ්‍රම වෙළඳපොළ තොරතුරු සියළුම ශ්‍රී ලාංකිකයන්ට ලබාදීම
10. දේශීය හා ගෝලීය ශ්‍රම වෙළඳපොළ නැම්යාවන් පූරෝකථනය


මේ අයුරින් විරැකියාව අවම කිරීම හා යහපත් රැකියා ඇතිකිරීම යන අරමුණු ඉටුකර ගැනීම උදෙසා මෙම දෙපාර්තමේන්තුව සිය මානව සම්පත් උපයෝගී කරගනිමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

## 1.3 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත පහත සඳහන් කාර්යයන් කිරීමට පැවරී ඇත.

- ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන කටයුතු
- වෘත්තීය මාර්ගෝපදේශනයට අයත් කටයුතු
- ශ්‍රම වෙළඳපල තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදාහැරීම
- රැකියා පියස (Jobs Net) මගින් සිදුකෙරෙන වෙනත් සේවාවන් සහ ඉහත විෂයන්ට ආනුෂාංගික සහ සම්බන්ධිත සෙසු සියලු කටයුතු.

## 1.4 සංවිධාන සටහන




1. ග්‍රාමීය රැකියා හා ක්‍ෂුද්‍ර මූල්‍ය වැඩසටහන
2. අවිධිමත් අංශයේරැකියා ප්‍රවර්ධනවැඩසටහන
3. රැකියා යෝග්‍යතාසංවර්ධන වැඩසටහන
4. රැකියා සමාජ වැඩසටහන

1. වෘත්තීය මාර්ගෝපදේශ තොරතුරු පද්ධති සැකසීම හා බෙදාහැරීම
2. වෘත්තීය මාර්ගෝපදේශ අධ්‍යනය හා පර්යේෂණ
3. වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

1. වැඩසටහන් සැලසුම් කිරීමමෙහෙයවීම හා ඇගයීම
2. ක්ෂේත්‍ර වැඩසටහන්සම්බන්ධීකරණය
3. නව වැඩසටහන් හඳුනාගැනීම හා සැලසුම් කිරීම.

1. සාමාන්‍යපරිපාලනය
2. කාර්ය මණ්ඩල හා ආයතන කටයුතු
3. දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන කටයුතු
4. ගබඩා සේවය
5. සුභසාධන කටයුතු

1. වාර්ෂික සැලසුම්සැකසීම හා වාර්තාසැකසීම.
2. කාර්ය මණ්ඩල සංවර්ධනය
3. ප්‍රගති ඇගයීම් කටයුතු
4. අනෙකුත් අංශ අතර සම්බන්ධීකරණය
5. දෙපාර්තමේන්තුප්‍රකාශන

1. ශ්‍රම වෙළඳපොළ ප්‍රවනතා අධ්‍යනය
2. ශ්‍රම වෙළඳපොළතොරතුරු එකතු කිරීම
3. විශ්ලේෂණයකිරීම හාබෙදාහැරීම

1. මිනිස්බලය පුරෝකථනයකිරීම.
2. ආංශික මිනිස්බල සැලසුම්සැකසීම
3. අදාළ ආයතන සමගසම්බන්ධීකරණය මගින් සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතුකිරීම
4. මිනිස්බල සංවර්ධනයසඳහා ආදාළ ප්‍රතිපත්තිහා යෝජනා ක්‍රමසැකසීම හා

1. ජාතිකරැකිරක්‍ෂා සේවාජාලයක් සැකසීමහා ක්‍රියාත්මකකිරීම
2. රැකියාසේවාසපයන ආයතනඅතරසම්බන්ධීකරණය
3. රැකියා පොළ

1. දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණ කටයුතු

1. දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු

## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ සහ කාර්ය භාරය

- පාලනඅංශය, සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය
- ගිණුම් අංශය
- රැකියා නිර්මාණ,ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය
    - රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන ඒකකය
    - වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය
- මිනිස්බල සැලසුම්,සංවර්ධන හා පර්යේෂණ අංශය
    - ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය
    - ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්ති ඒකකය
    - මහජන රැකියා සේවය
- අභ්‍යන්තර විගණන අංශය

## 1.5.1පාලන අංශය

පාලන අංශය යටතේ පහත සඳහන් ඒකකයන් ස්ථාපිත කර ඇත.

i. ආයතන අංශය
ii. සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය

දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඉටු කිරීම උදෙසා අභ්‍යන්තර පාලන ක්‍රියාවලියට දායක වීම තුලින් විශිෂ්ඨ කාර්ය සාධනයක් ළඟා කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ ඉහළ කළමණාකාරිත්වයට සහය වීම පිණිස ආයතන කටයුතු හා සාමාන්‍ය පරිපාලන කටයුතු මෙහෙයවීම ඇගයීම හා නංවාලීම පාලන අංශය වෙත පැවරී ඇති මූලික කර්තව්‍යයකි. ඊට අමතරව දෙපාර්තමේන්තුවේ ගුණාත්මක භාවය පවත්වා ගැනීම සඳහා ප්‍රයෝජනවත් භෞතික අභිමතාර්ථයන්ට හා කාර්යයන්ට ගැළපෙන උසස් තත්ත්වයක් සහිත සේවක මණ්ඩලයක් පවත්වා ගැනීම, අංශ අතර මනා විධිමත් සම්බන්ධීකරණයක් ඇතිකර ගැනීම, කාර්යය මණ්ඩලයේ සුභ සාධන පහසුකම් නංවාලීම හා සෙසු අංශයන් සඳහා අවශ්‍ය සහායක සේවා සැපයීම ද පාලන අංශය මඟින් සිදු කරනු ලබයි.

### 1.5.1.1 ආයතන අංශය

නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම, පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම , දෛනික තැපැල, බඳවා ගැනීම් විනය පාලනය ඇතුලු දෙපාර්තමේන්තු මෙහෙයුම් පරිපාලන කටයුතු,ප්‍රවාහන කටයුතු ප්‍රධාන වශයෙන් මෙම අංශය මඟින් සිදු කරනු ලබන අතර නිලධාරීන් 25 දෙනෙකුගෙන් මෙම අංශය සමන්විත වේ.

### 1.5.1.2 සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය

දෙපාර්තමේන්තුවේ වාර්ෂික ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ප්‍රගතිය ඇගයීම හා වාර්තා කිරීම, ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම හා මෙහෙයවීම, දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ සමස්ත ප්‍රගතිය පිළිබඳ අමාත්‍යශය ඇතුලුව එම තොරතුරු ඉල්ලා සිටින ආයතන දැනුවත් කිරීමයන කටයුතු ප්‍රධාන වශයෙන් මෙම අංශයෙන් සිදු වන අතර නිලධාරීන් 13 ක් මෙම ඒකකය යටතේ සේවය කරනු ලබයි.

## 1.5.2 ගිණුම් අංශය

දෙපාර්තමේන්තුවේ මූල්‍ය පරිපාලනමය කටයුතු මෙම අංශය මඟින් සිදු කරනු ලබන අතර නිලධාරීන් 13 ක් මෙම අංශය යටතේ රාජකාරී කටයතු සිදු කරනු ලබයි.

### 1.5.3 රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය

වෘත්තීය මාර්ගෝපදේශ හා රැකියා නිර්මාණ, ප්‍රවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කරන විවිධ, එකිනෙක යා වූ වැඩසටහන් මාලාවක් තුළින් සමස්ථ ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය නිසි වෘත්තීන් කෙරේ යොමු කරවීම, නව රැකියා අවස්ථාවන් නිර්මාණය කිරීම මෙන්ම ජාතික ප්‍රතිපත්ති හා පුද්ගල හැකියා හා දක්ෂතාවයන්ට අනුකූල රැකියාවන් ප්‍රවර්ධනය කිරීමත් යන පුළුල් පරාසයක පැතිරුණ කාර්යය භාරයක් ඉටු කරනු ලබයි.

මෙම කාර්යභාරය සාර්ථකව ඉටු කිරීම සඳහා අංශය ඒකක දෙකකට බෙදා ඇති අතර, ඒ ඒ ඒකකය සහකාර අධ්‍යක්ෂවරයකුගේ මග පෙන්වීම යටතේ මෙම කාර්යයන්හි නිරත වේ. ශ්‍රී ලංකාව පුරා දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇති වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් හා සංවර්ධන නිලධාරී මඟින් මෙම වැඩසටහන් බිම් මට්ටම කරා රැගෙන යාම සිදු වේ.

ඒ අනුව මෙම අංශය යටතේ පහත සඳහන් ඒකකයන් ස්ථාපිත කර ඇත.

#### <u>රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන ඒකකය</u>

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය තුළ තරුණ සේවා වියුක්තිය බලවත් වෙමින් පවතින බව ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව පෙනීයන කරුණක් වේ. එම සේවා වියුක්ති තොරතුරු අනුව උගත් තරුණ සේවා වියුක්තිය රටේ ප්‍රධාන අභියෝගයක් බව පෙනී යයි. මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවේ අරමුණ ඉලක්ක ගත වන්නේ ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති ගැටළුව අවම කිරීම පෙර දැරි කරගෙනය.

ලෝක මට්ටමේ ශ්‍රම බලකායක් ඇති කිරීම අරමුණු කරගෙන තම කාර්යයන් දියත් කරන මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවේ රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන ඒකකය ප්‍රධාන අරමුණු දෙකකින් ශ්‍රී ලංකාවේ විරැකියා ප්‍රශ්නයට පිළියම් සෙවීමට මැදිහත් වේ.


- රැකියා නිර්මාණය කිරීම
- රැකියා ප්‍රවර්ධනය කිරීම

#### <u>වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය</u>

රටක සංවර්ධනයෙහි ගාමක බලවේගය වන්නේ මානව සම්පතයි. අප රටේ මානව සම්පත පිළිබඳ අධ්‍යයනයේදී පාසල් අධ්‍යාපනයේ විවිධ අදියරවලින් නුපුහුණු ශ්‍රමිකයින් ලෙස තරුණ ප්‍රජාව ශ්‍රම බලකායට එකතුවන අතර ශ්‍රම වෙළෙඳ පොලෙහි රැකියා කුසලතා නොගැලපීමේ ගැටළුව, රැකියා මනාපය, ශ්‍රම බලකා සහභාගීත්වය අඩුවීම, වෙළෙඳපොළ නව ප්‍රවනතා පිළිබඳ අඩු අවබෝධය, නිවැරදි වෘත්තීය සැලැස්මක් නොමැතිවීම, උගත් තරුණ ප්‍රජාව අතර ඉහළ විරැකියා අනුපාතය ආදී ගැටළු රාශියක් දක්නට ලැබේ.

රටේ සංවර්ධනයට දායක වන ඵලදායී මානව සම්පතක් ගොඩනැගීම උදෙසා වෘත්තීය මාර්ගෝපදේශය හා උපදේශනය මඟින් ප්‍රබල දායකත්වයක් ලබාදේ. එම නිසා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ වෘත්තීය මාර්ගෝපදේශය ලෙස අපගේ අරමුණ වන්නේ සේවා ලාභීන්ගේ වෘත්තීය වරණය හා වෘත්තීය සංවර්ධනය මඟින් රටේ මානව සම්පත්වල මුළු ශක්තිය කාර්යක්ෂම හා ඵලදායි ලෙස රටේ සංවර්ධනයට යොදාගනිමින්, ජාත්‍යන්තරයට ගැලපෙන මානව සම්පතක් බිහිකිරීම උදෙසා දායක වීමයි.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා මෙම ඒකකයන් දෙක මගින් **රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටින හා නව්‍ය ලෙස රැකියා වෙළඳපල වෙත ප්‍රවේශ වන හා අනාගතයේ ප්‍රවේශ වීමට නියමිත ජනතාව වෙත සේවා නියුක්ති ආශ්‍රිත පහසුකම් සැපයීමේ අරමුණින් විවිධ** වැඩසටහන් පවත්වනු ලබයි.




## රැකියා නිර්මාණ වැඩසටහන්

### ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

ලක්ෂ දෙකක පමණ රැකියා අපේක්ෂිතයින් පිරිසක්, වාර්ෂිකව ශ්‍රී ලංකා ශ්‍රම බලකායට ඇතුළු වන බව ගණන් බලා ඇත. නව රැකියා උත්පාදන මූලාශ්‍ර හරහා ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය අවම කිරීමේ අරමුණ ඇතිව දෙපාර්තමේන්තුව පහත සඳහන් වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.**ග්‍රාමීය ආර්ථිකය ගොඩනැංවීම තුළින් රැකියා අවස්ථා ජනිත කිරීමත් ව්‍යවසායකයින් හා ස්වයං රැකියා ලාභීන් ජනිත කිරීමත් මෙහි ප්‍රධාන අරමුණකි. මේ මගින් ව්‍යවසායකත්වය දියුණු කිරීම මගින් ආදායම් උත්පාදන මාර්ග සඳහා තරුණ ප්‍රජාව බල ගන්වනු ලබයි.**

මෙම වැඩසටහන මානව සම්පත් සංවර්ධන සහකාර හා සංවර්ධන නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් තෙදින වැඩසටහනක් ලෙස පවත්වනු ලැබේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දැනට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික කටයුතු වල නියුතු ව්‍යවසායකයින් සහ නව ව්‍යාපාර ආරම්භ කිරීමට බලාපොරොත්තුවන ප්‍රතිලාභීන් සඳහා මෙය සිදු කරනු ලබන අතර වැඩසටහනට

සහභාගිවන ප්‍රතිලාභීන්ගේ ව්‍යාපාරික දියුණුව සඳහා පහත සඳහන් දායකත්වය අප දෙපාර්තමේන්තුව මගින් සපයා දෙනු ලබයි.

- ව්‍යවසායකත්ව ගති ලක්ෂණ ගොඩ නංවා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම.
- කළමණාකරණය, අලෙවිකරණය, මහජන සම්බන්ධතා, මිල කිරීම යනාදී දෑ පිලිබඳව මග පෙන්වීමක් සිදු කරයි.
- ජීවිත දර්ශනය හා ව්‍යාපාරික දර්ශනය ගොඩා නගා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම.
- ව්‍යාපෘති වාර්තා සකස් කිරීම පිලිබද පුළුල් දැනුමක් ලබා දීම.
- මූල්‍ය පහසුකම් සඳහා ආයතන සම්බන්ධීකරණය සිදු කිරීම යනාදිය සිදු කරයි.
- පුහුණුවට අදාල සහතික පත්‍රයක් ලබා දීම සිදු කෙරේ.

අවිධිමත් ලෙස ස්වයං වයාපාර වල නිරත වන ව්‍යවසායකයින් විධිමත් කිරීම සඳහා ව්‍යවසායකත්ව පුහුණුව ලබා දීම තුලින් ඔවුන්ගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කිරීම තුළින් ව්‍යාපාර සංවර්ධනය කර එම ප්‍රදේශය තුල නව රැකියා අවස්ථා ප්‍රාදේශීය මට්ටමින් බිහි කිරීමද තවත් කාර්යයකි. මෙම වැඩසටහන තුළින්,...

- වෙළෙඳපොළ ගැටළු අවම කිරීම.
- විකිණීම් උපරිම කිරීම.
- නිර්මාණශීලිත්වය තුළින් ගුණාත්මක භාණ්ඩ නිෂ්පාදනය කිරීම.
- දැනුම, ආකල්ප, කුසලතා වැඩි දියුණු කිරීම.
- ව්‍යාපාරික අවස්ථා හදුනාගැනීම වැඩි දුරටත් සිදු කෙරේ.

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වනුයේ, ශ්‍රී ලංකාවේ දැනට ව්‍යවසායක කාර්යයෙහි නිරත වන ව්‍යවසායකයින්ගේ ව්‍යවසායකත්ව හැකියා සංවර්ධනය කිරීම තුළින් ව්‍යවසායකයින්ගේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම වේ.

## අවශ්‍යතා මත පුහුණු වැඩසටහන

මෙම වැඩසටහන මානව සම්පත් සංවර්ධන සහකාර හා සංවර්ධන නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් දින හතරක වැඩසටහනක් ලෙස පවත්වනු ලැබේ.ප්‍රාදේශීයව පවතින ව්‍යවසායකත්ව හා රැකියා ප්‍රවර්ධන අවශ්‍යතා හදුනාගෙන, ප්‍රතිලාභීන් පුහුණු කරමින් ඔවුන්ගේ දැනුම, කුසලතා, හා ආකල්ප දියුණු කිරීම අරමුණු කරගෙන දෙපාර්තමේන්තුව ක්‍රියාවට නංවන ප්‍රමුඛ වැඩසටහනක් වේ.

ප්‍රාදේශීයව පවතින සම්පත් වලින් එම ප්‍රදේශයට ගැලපෙන රැකියා අවස්ථා ජනිත කිරීම හා එම සම්පත් වලින් උපරිම වශයෙන් ප්‍රයෝජන ගැනීම අරමුණු කරගෙන ක්‍රියාවට නංවන මෙම වැඩසටහන ග්‍රාමීය රැකියා වියුක්තිය අවම කිරීමට ඉවහල් වන වැඩසටහනකි. රැකියා විරහිත තරුණ තරුණියන්ගේ අවශ්‍යතා වලට ගැලපෙන පරිදි ආදායම් තත්වය නංවාලීමේ අරමුණින් හා ස්වයං රැකියා උත්පාදනය වර්ධනය අරමුණු කරගනිමින් ක්‍රියාත්මක කරන වැඩසටහනකි.

ව්‍යාපාරවල නිරත වන ප්‍රතිලාභීන්ගේ ව්‍යාපාරවලට අදාල වන තාක්ෂණික දැනුම හා කළමණාකරණ දැනුම, ව්‍යාපාරික නීතිය, ධාරිතාවය නැංවීමට සහය වීම මෙයින් සිදුවේ.

## උද්‍යාන අලංකරණය

මෙම වැඩසටහන මානව සම්පත් සංවර්ධන සහකාර හා සංවර්ධන නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් දින දා හතරක වැඩසටහනක් ලෙස පවත්වනු ලැබේ. **ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහනක් ලෙස** **මෙම** වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පැවැත්වේ. තෝරාගන්නා ලද පිරිසක් සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

ප්‍රතිලාභීන් ඔවුන්ගේ නිර්මාණශීලී අදහස් හා ඔවුන්ගේ මූල්‍ය ශක්තිය මත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා අනුව ගනු ලැබේ.

## රැකියා ප්‍රවර්ධන වැඩසටහන්

### ස්වයං රැකියා පෙළඹවීමේ වැඩසටහන

රටක ආර්ථික සංවර්ධනයේදී ස්වයං රැකියා ක්ෂේත්‍රයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. එම නිසා ස්වයං රැකියා සඳහා හැකියාවක්, දක්ෂතාවයක් ඇති තරුණ තරුණියන් ඒ සඳහා යොමු කිරීම කාලීන අවශ්‍යතාවයකි. එම අරමුණ පෙරදැරි කරගත් වැඩසටහනක් ලෙස මෙය ක්‍රියාත්මක වේ.මෙම වැඩසටහන මානව සම්පත් සංවර්ධන සහකාර හා සංවර්ධන නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් දින එකක වැඩසටහනක් ලෙස පවත්වනු ලැබේ

### ප්‍රාදේශීය රැකියා පොළ වැඩසටහන

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ රැකියා අපේක්ෂිතයින් හා රැකියා සපයන්නන් එක් ස්ථානයකට රැස්කොට, රැකියාගත වීමේ කටයුතු සඳහා පහසුකම් සැලසීම වේ.සම්මුඛ පරීක්ෂණ මගින් වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදු කෙරේ.ආකල්ප සංවර්ධන වැඩසටහන්, රැකියා ක්ෂේත්‍ර පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්,ඔස්සේ විවිධ රැකියා සඳහා පෙළඹවීම් ඇති කෙරේ. ඒ ඔස්සේ පෞද්ගලික අංශයේ රැකියා ආයතන පිළිබඳ දැනුවත් කර සම්මුඛ පරීක්ෂණ සඳහා යොමු කිරීම සිදු කරන අතර එසේ රැකියා ගත කරන්නන් සම්බන්ධයෙන් පසු විපරම්ද දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

**ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියෙන් 58% ක් පමණ අවිධිමත් අංශයට අයත් වේ.** දෙපාර්තමේන්තුව මෙහෙය වන වැඩසටහන් වන තෙදින ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන , ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන්, අවශ්‍යතා මත පුහුණු වැඩසටහන, ප්‍රාදේශීය රැකියා පොළ වැඩසටහන යන වැඩසටහන් මගින් මෙම අවධිමත් අංශය විධිමත් කර සංවර්ධනය කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.

## වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්

රටක සංවර්ධනයෙහි ගාමක බලවේගය වන්නේ මානව සම්පතයි. අප රටේ මානව සම්පත පිළිබඳ අධ්‍යයනයේදී පාසල් අධ්‍යාපනයේ විවිධ අදියරවලින් නුපුහුණු ශ්‍රමිකයින් ලෙස තරුණ ප්‍රජාව ශ්‍රම බලකායට එකතුවන අතර ශ්‍රම වෙළෙඳ පොලෙහි රැකියා කුසලතා නොගැලපීමේ ගැටළුව, රැකියා මනාපය, ශ්‍රම බලකා සහභාගීත්වය අඩුවීම, වෙළෙඳපොළ නව ප්‍රවනතා පිළිබඳ අඩු අවබෝධය, නිවැරැදි වෘත්තීය සැලැස්මක් නොමැතිවීම, උගත් තරුණ ප්‍රජාව අතර ඉහළ විරැකියා අනුපාතය ආදි ගැටළු රාශියක් දක්නට ලැබේ.

රටේ සංවර්ධනයට දායක වන ඵලදායි මානව සම්පතක් ගොඩනැගීම උදෙසා වෘත්තීය මාර්ගෝපදේශය හා උපදේශනය මගින් ප්‍රබල දායකත්වයක් ලබාදේ. එමනිසා මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවේ වෘත්තීය මාර්ගෝපදේශය ලෙස අපගේ අරමුණ වන්නේ සේවා ලාභීන්ගේ වෘත්තීය වරණය හා වෘත්තීය සංවර්ධනය මගින් රටේ මානව සම්පත්වල මුළු ශක්තිය කාර්යක්ෂම හා ඵලදායි ලෙස රටේ සංවර්ධනයට යොදාගනිමින්, ජාත්‍යන්තරයට ගැලපෙන මානව සම්පතක් බිහිකිරීම උදෙසා දායකවීමයි

### වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශන සේවා

**පෞද්ගලික හා කණ්ඩායම් මට්ටමින් වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශන සේවාවන් ලබාදීම**

| | | |
|---|---|---|
| වැඩසටහනේ අරමුණ | : | අධ්‍යාපනික හා වෘත්තීය සංවර්ධනය උදෙසා සවිබලගැන්වීම |
| සේවය ලබාදෙන දිනයන් | : | සතියේ සඳුදා හා බදාදා දිනයන්හිදී |
| සේවය ලබාදෙන ස්ථාන | : | සියළු දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හිදී |
| සම්පත්දායකත්වය | : | වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරින් / මානව සම්පත් සංවර්ධන නිලධාරීන් / සංවර්ධන නිලධාරීන් |

වැඩ ලොවට පිවිසෙන සේවාලාභීන්ගේ වෘත්තීයකට පිවිසීම, නියැලීම, වෘත්තීය සංවර්ධනය ආදි විවිධ අදියරයන් වලදී මෙන්ම ජීවිතයේ සෑම තීරණාත්මක අවස්ථාවලදී අවශ්‍ය තීරණ ගැනීම උදෙසා සවිබලගැන්වීම අත්‍යවශය වේ. මේ සඳහා පෞද්ගලික උපදේශනය මගින් ඉටු වන්නේ සුවිශාල මෙහෙවරකි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් තාර්යාලයන්හි සේවයේ නියුතු වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරින් / මානව සම්පත් සංවර්ධන නිලධාරීන් / සංවර්ධන නිලධාරීන් මගින් සේවාලාභීන් උදෙසා කණ්ඩායම් හා පෞද්ගලික මට්ටමින් උපදේශන සේවාවන් ලබා දෙනු ලැබේ.

### වෘත්තීය මාර්ගෝපදේශ වැඩමුළු

**ජීවිතයට හරි තීරණයක් අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ.) සිසුන් දැනුවත් කිරීමේ වෘත්තීය මාර්ගෝපදේශ වැඩමුළුව**

වෘත්තීය සැලැස්මක් සකස් කරගැනීමට සහාය වීම හා අධ්‍යාපන, වෘත්තිය අධ්‍යාපන, වෘත්තීමය පාඨමාලා, ස්වයං රැකියා ක්ෂේත්‍ර වැනි විවිධ විකල්ප මාර්ග පිළිබඳ අවබෝධය ලබාදීම අරමුණු කර ගනිමින් වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන්ගේ හා මානව සම්පත් සංවර්ධන නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් දින එකක වැඩසටහනක් ලෙස පැවැත්වේ. මෙහි එක් වැඩසටහනක් සඳහා උපරිම ප්‍රතිලාභීන් සංඛ්‍යාව 30කි.

වර්ෂයකට අ.පො.ස (උ.පෙළ.) විභාගයෙන් 5% පමණ පිරිසක් විශ්ව විද්‍යාල සඳහා සුදුසුකම් ලබන අතර තවත් විශාල ප්‍රමාණයක් නුපුහුණු ශ්‍රමිකයන් ලෙස වෘත්තීය සැලැස්මකින් තොරව වැඩලෝකයට පිවිසේ. මෙනිසා පාසලින් ඉවත් වන දරුවන්ට පාසලින් ඉවත්වීමට ප්‍රථම වෘත්තීය සැලැස්මක් සහිතව වැඩලෝකයට පිවිසීමටත්, ඵලදායි ලෙස වැඩලෝකයට අනුගතවීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ හා උපදේශන සේවාවන් ලබාදීම අත්‍යවශය වේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සාමාන්‍ය පෙළ පාසල් සිසුන්, උසස් පෙළ පාසල් සිසුන් හා පාසල් පද්ධතියෙන් බැහැර වන සිසුන් අරඹයා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම සිදු කරනු ලැබේ. Career Me ආයතනය සමගඅවබෝධතා ගිවිසුමක් දෙපාර්තමේන්තුව විසින් අත්සන් කර ඇති අතර එමගින් මාර්ගගත පෞරුෂත්ව පරීක්ෂා සඳහා විශේෂයෙන් පාසල් සිසුන් හට අවස්ථාව සැලසෙන අතර දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් එම පෞරුෂත්ව පරීක්ෂා තොරතුරු මත අවශ්‍ය වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දෙනු ලබයි.




මෙම පාසල් කණ්ඩායම් වලට අමතරව ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිටින හා බාහිර උපාධි හදාරන සිසුන් සඳහා ද වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් වාර්ෂිකව පවත්වා ගෙන යනු ලබයි. මේ මගින් උගත් තරුණ පිරිසගේ රැකියා වියුක්තිය අවම කිරීම අරමුණු කරයි.

## "ඔබ අසිරිමත්ය" උපාධි අපේක්ෂිතයින් දැනුවත් කිරීමේ වැඩසටහන

වර්ෂයකට ශ්‍රී ලංකාවේ දක්ෂතම සිසුන් ලෙස විශ්ව විද්‍යාල වරම් ලබන උපාධි අපේක්ෂිතයින් තුළ ඉදිරි දැක්මක් සහිතව ජීවිතය සැලසුම් කොට ගෙන නිර්මාණශීලිව වැඩ ලෝකයට අනුගත වීමටත්, ඔවුන්ගේ විභව්‍යතාවයන්හි මුළු ශක්තිය රටේ සමාජ ආර්ථික සංවර්ධනයට යොදාගැනිම අත්‍යවශ්‍ය මෙන්ම කාලීන අවශ්‍යතාවයකි. එම අරමුණ පෙරදැරිකරගෙන මෙය තෙදින වැඩසටහනක් ලෙස විශ්වවිද්‍යාල සිසුන් උදෙසා වෘත්තීය මාර්ගෝපදේහ නිලධාරීන්ගේ හා මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරීන්ගේ සම්පත්දායකත්වයෙන් අප දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.මෙම වැඩසටහනෙහි එක් වැඩසටහනක් සඳහා අපේක්ෂිත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 40කි.

තවද පාසල් ගුරුවරුන් හා දෙමාපියන් සඳහා ද වෘත්තීය වරණය පිළිබඳ දැනුවත් කිරීම් ද සිදු කරනු ලැබේ.

## ගුරුවරුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව

පාසල් සිසුන් විශාල ප්‍රමාණයක් විවිධ මට්ටම්වලදී නුපුහුණු ශ්‍රමිකයින් ලෙස වාර්ෂිකව ශ්‍රම බලකායට එකතුවේ. එම නිසා පාසල් කාලය තුලදී පාසල් ළමුන්ට සිය අනාගත වෘත්තීය සැලැස්ම සකස් කර ගැනීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශය හා උපදේශනය ලබාදීම අත්‍යවශ්‍ය වේ. එමගින් පාසලින් වැඩලොවට පිවිසෙන දරුවන් ඵලදායි ලෙස වැඩලෝකයට අවශෝෂණය කරගත හැකිවේ. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන්ගේ හා මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරීන්ගේ සම්පත්දායකත්වයෙන් දෙදින වැඩසටහනක් ලෙස මෙය පවත්වනු ලැබේ .මෙම වැඩසටහනෙහි එක් වැඩසටහනක් සඳහා උපරිම ප්‍රතිලාභීන් සංඛ්‍යාව 40කි.

## දෙමාපියන් දැනුවත් කිරීමේ වෘත්තීය මාර්ගෝපදේශ වැඩමුළු

මේ වෙනස්වන සමාජ ආර්ථික රටාව තුළ දරුවන් නිසි මගට යොමු කර රටට ඵලදායී පුරවැසියෙකු බිහි කිරීම දෙමාපියන්ගේ වගකීමයි. එම නිසා වෙනස් වන සමාජ ආර්ථික රටාව තුළ අධ්‍යාපන ක්ෂේත්‍ර, වෘත්තීය ක්ෂේත්‍ර පිළිබඳ පමණක් නොව දරුවන් නිවැරදිව හදා වඩා ගැනීමේ රටාව පිළිබඳවද දෙමාපියන් දැනුවත් වීම අත්‍යවශ්‍ය වේ. එමනිසා දරුවන්ගේ දක්ෂතා හඳුනා ගැනීම වෙනස් වන අධ්‍යාපන හා රැකියා ක්ෂේත්‍ර පිළිබඳවත්, දරුවන් හදා වඩා ගැනීමේ ක්‍රමවේද පිළිබඳවත් දැනුවත් කිරීම හා ඔවුන්ගේ දැනුම අලුත් කිරීම කාලීන අවශ්‍යතාවයකි. එය දරුවාගේ අනාගත වෘත්තීය සංවර්ධනයට සෘජු ලෙසම බලපෑම් සහගත වේ.මේ පිළිබඳ දැනුවත් කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ.වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන්ගේ හා මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් එක්දින වැඩසටහනක් ලෙස මෙය පවත්වනු ලැබේ .මෙම වැඩසටහනෙහි එක් වැඩසටහනක් සඳහා උපරිම ප්‍රතිලාභීන් සංඛ්‍යාව 50 කි.

## වෘත්තිය සැලසුම් ජය ගැනීම - රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා

පාසල් අධ්‍යාපනයෙන් පසුව තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක් නිවැරැදි වෘත්තීය සැලැස්මකින් තොරව, රැකියාවක් නොමැතිව නිකරුණේ කාලය ගතකරන අතර එය රටේ සමාජ ආර්ථික සංවර්ධනයට බාධාවක් වන අතර විවිධ අර්බුධ නිර්මාණයවීම සඳහාද බලපෑම් සහගත වේ. එබැවින් ඉදිරි දැක්මක් සහිතව ජීවිතය සැලසුම් කොට ගැනීමටත්, නිර්මාණශීලිව වැඩ ලෝකයට අනුගත වීමටත් අවශ්‍ය මාර්ගෝපදේශය හා උපදේශනය ලබාදීම අත්‍යවශ්‍ය වේ.වෘත්තීය මාර්ගෝපදේහ නිලධාරීන්ගේ හා මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරීන්ගේ සම්පත්දායකත්වයෙන් එක්දින වැඩසටහනක් ලෙස මෙය පවත්වනු ලැබේ .මෙම වැඩසටහනෙහි එක් වැඩසටහනක් සඳහා උපරිම ප්‍රතිලාභීන් සංඛ්‍යාව 30 කි.

## වෘත්තීය මාර්ගෝපදේශ ප්‍රකාශන

**හසර වෘත්තීය මාර්ගෝපදේශ අධ්‍යාපනික හා තොරතුරු සංග්‍රහය**

| | | |
|---|---|---|
| වැඩසටහනේ අරමුණ | : | වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශනය ආශ්‍රිත දැනුම සමාජගත කිරීම තුළින් ඉලක්ක ප්‍රජාව සවිබල ගැන්වීම |
| කාලය | : | වසරකට සඟරා 4 කි. |
| සංස්කරණය | : | වෘත්තීය මාර්ගෝපදේශ නිළධාරීන් |
| ඉලක්ක කණ්ඩායම | : | පාසල් සිසුන්, රැකියා විරහිත තරුණ තරුණියන්, රැකියාගත වෘත්තීය සංවර්ධනය අපේක්ෂා කරන්නන්, වෘත්තිකයින් |

රටේ සංවර්ධනයට දායක වන විභවතාවයන්ගෙන් හා දැනුම කුසලතා ආකල්ප යුත් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමේදී සඟරා පුවත් පත් වැනි ලිඛිත මාධ්‍ය හා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන්ගෙන් ඉටුවන්නේ ඉතා ඉහළ මෙහෙයකි. ඒ අනුව අපේ රටට තවමත් නව්‍ය සංකල්පයක් වූ වෘත්තීය මාර්ගෝපදේශය හා උපදේශනය සමාජගත කොට තරුණ තරුණියන් සතු විභවතාවය රටේ සංවර්ධනයට යොදා ගැනිමටත්, රටේ සංවර්ධනයට උචිත දැනුම කුසලතා ආකල්පවලින් යුතු ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමත් අත්‍යවශ්‍ය වේ.

එය අරමුණු කරගත් හසර වෘත්තීය මාර්ගෝපදේශ හා අධ්‍යාපනික ප්‍රකාශය වසර 2000 සිට දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන අතර මෙම විෂය පිළිබඳව සිංහල භාෂාවෙන් පළ කරනු ලබන ප්‍රථම සඟරාව ද වේ. මෙම සඟරාව පාසල්, විශ්වවිද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන, නගර සභා මඟින් පාලනය වන පුස්තකාල සඳහා නොමිලේ නිකුත් කරනු ලැබේ. සඟරාව සඳහා අන්තර්ගත වන ලිපි සකස් කිරීම දෙපාර්තමේන්තුවේ එම විෂය පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත් නිලධාරීන්ගෙන් හා වෘත්තීය මාර්ගෝපදේශ විෂයේ ප්‍රවීණයන් හා සම්මුඛ සාකච්ඡා පැවැත්වීම තුලින් සිදු වේ. දෙපාර්තමේන්තුවේ කාර්යභාරයත් සමඟ පහත විෂයන් සම්බන්ධයෙන් ලිපි පල කිරීමේදී විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

I. වෘත්තීය මාර්ගෝපදේශය විෂයට අදාළ ලිපි
II. රැකියා ලෝකයේ නව ප්‍රවණතා
III. වෘත්තීය මාවත් හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර
IV. සාර්ථක වෘත්තිකයෙකු ලෙස රටේ කීර්තිනාමයක් සහිත පුද්ගලයන් සමඟ සම්මුඛ සාකච්ඡා ඇසුරින් සකස් කළ ලිපි
V. පාසල් සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීමට අදාළ ලිපි

## 1.5.4 මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය

ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළ ජාලයේ ශ්‍රී ලාංකික කොටස්කරුවා වශයෙන් කාර්යක්ෂම හා ඵලදායි තීරණ ගැනීම සඳහාත්, ප්‍රතිපත්ති සම්පාදන කාර්යය සඳහාත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපන වැඩසටහන් , පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන් සම්පාදකයින් සඳහාත් අවශ්‍ය ශ්‍රම වෙළඳපොළ තොරතුරු භාවිතයට පහසු වන ආකාරයෙන් සියළු පාර්ශවකරුවන් වෙත සම්පාදනය කර දීම උදෙසා බිහි කරන ලද අංශයයි.

මෙම අංශය ප්‍රධාන ඒකක 03 ක් යටතේ ක්‍රියාත්මක වේ


- ☆ ශ්‍රමවෙළඳපොළතොරතුරුඒකකය
- ☆ ජාතික රැකියා කේන්ද්‍රය
- ☆ ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිමෙහෙයුම් ඒකකය

**<u>ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය</u>**

ශ්‍රම වෙළඳපොළ තොරතුරු රැස් කිරීමේ දී සීඝ්‍රව වෙනස් වන කුසලතා සපිරි මානව සම්පත සඳහා ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම මනාව අධීක්ෂණය කිරීම හා තක්සේරු කිරීම අත්‍යවශ්‍ය වේ.මෙම ඒකකය මඟින් ශ්‍රම වෙළඳපොළ තොරතුරු රැස්කිරීම,විශ්ලේෂණය කිරිම හා බෙදා හැරීම සිදු කරනු ලබයි.

එමෙන් ම ලංකාවේ කාලීන හා සංවර්ධන අවශ්‍යතාවන්ට සරිලන ලෙස ශ්‍රම වෙළඳපොළ පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම, ශ්‍රම ඉල්ලුම හා සැපයුම පිළිබඳ අධ්‍යයනය සිදු කිරීම හා එම තොරතුරු බෙදා හැරීම ශ්‍රම වෙළඳපොළ තොරතුර ඒකකයෙන් සිදු කරනු ලැබේ.

ශ්‍රම වෙළඳපොළ තොරතුරු සඟරාව හා පාසල් පාදක දත්ත අත්පොත මේ මගින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.






## 2019 වර්ෂයේ ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය මඟින් යෝජිත වූ වැඩ සටහන්

### 01. ශ්‍රම වෙළඳපොළ තොරතුරු සඟරාව ( Annual LMI Bulletin)

ශ්‍රම වෙළඳපොළ තොරතුරු සඟරාව සඳහා ශ්‍රම ඉල්ලුම, ශ්‍රම සැපයුම විදේශ රැකියා හා ශ්‍රම ඵලදායිතාවය පිළිබඳ තොරතුරු ඇතුළත් කර ඇත.මේ සඳහා තොරතුරු ලබාගෙන ඇත්තේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ශ්‍රම බලකා සමීක්ෂණය, ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව,විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වාර්තා හා දත්ත පදනම් කරගෙනය.

ශ්‍රම වෙළඳපොළ හැසිරීම පිළිබඳ කාලීන දත්ත එම පරිශීලකයින්ට මෙන්ම වෘත්තීය පුහුණුවක් ලබන්නන්ට ,විශ්ව විද්‍යාල සිසුන්ට ලබාදීම මෙහි අරමුණ වෙයි.මුද්‍රිත පිටපත් 1500ක් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කාර්යාල වල වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරින්, මානව සම්පත් සංවර්ධන නිලධාරින්,මහජන පුස්තකාල,විශ්ව විද්‍යාල සිසුන් සඳහා බෙදා හරිමින් පවතියි.

### 02. ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඇතුළත් DVD තැටි සකස් කිරිම.

මෙම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත නිලධාරින් සඳහා ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ පිළිබඳ යාවත්කාලින තොරතුරු ලබා දීම අත්‍යවශ්‍ය වුව ද එම තොරතුරු ලබා ගැනීමේ විවිධ අපහසුතා පැවතිම හා ඇතැම් නිලධාරින් ශ්‍රම වෙළඳපොළ යාවත්කාලින තොරතුරු පිළිබඳ නොදැනුවත්කම නිසා ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඇතුළත් DVD තැටි සකස් කිරීමට තීරණය කරන ලදී.සංයුක්ත තැටි 550 ක් සකස් කර ප්‍රධාන කාර්යාල නිලධාරින් ,ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කාර්යාල වල වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරින්, මානව සම්පත් සංවර්ධන නිලධාරින් වෙත ලබා දෙන ලදී.

### 03. මාසික ශ්‍රම වෙළඳපොළ සඟරාව (Monthly LMI News Letters)

ජාතික සහ ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළට ප්‍රවිෂ්ඨ වීමට අවශ්‍ය නිපුණතාවයන් පුහුණුවීම් ආදිය පිළිබඳ ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කාර්යාල වල වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරින්, මානව සම්පත් සංවර්ධන නිලධාරින් දැනුවත් කිරීම සහ ඒ මඟින් ඔවුන්ගේ වැඩසටහන් වලට සහභාගී වන ශිෂ්‍යයින් රැකියා විරහිත පුද්ගලයින් සඳහා දැනුවත් කිරීමට අවශ්‍ය කාලීන තොරතුරු ඇතුළත් කර ඇත .ශ්‍රම වෙළඳපොළ මාසික සඟරාව මාතෘකා 04 ක් යටතේ එකකින් 300 බැගින් 1200ක් මුද්‍රණය කර ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කාර්යාල වල වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරින්, මානව සම්පත් සංවර්ධන නිලධාරින් වෙත ලබා දෙන ලදී.

### 04. ආංශික අධ්‍යයනය (Sectorial Studies)

ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ පිළිබඳ යාවත්කාලින තොරතුරු ලබා දීම සඳහා දත්ත ඇතුළත් කර ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකයේ නිළධාරින් විසින් මසකට වරක් එක් එක් නිළධාරියා විසින් සකස් කරනු ලැබූ මාසික වාර්තා 16ක් වෙබ් අඩවියේ පළ කිරීම කරන ලදී.

### 05. සමාජ ආර්ථික දත්ත අත්පොත

පාසල් අධ්‍යාපනයේ කඩඉම් ජය ගැනීමට හා ඉන් අනතුරුව උසස් අධ්‍යාපනය කරා යාමට වෙර දරන දරුවන්ට අත්වැලක් වීමටත් ඒ හා සමගාමීව දේශීය හා විදේශීය සමාජීය ආර්ථික ප්‍රවණතා විශේෂයෙන්ම ශ්‍රම වෙළඳපොළ පිළිබඳ මූලික අවබෝධයක් ලබාදීමත් අරමුණු කරගෙන වාර්ෂිකව සමාජ ආර්ථික දත්ත අත්පොත ප්‍රකාශයට පත්කරනු ලැබේ. මෙම ග්‍රන්ථය ප්‍රකාශයට පත් කරන ලදුව,දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් දිවයින පුරා පාසල් 7674 වෙත බෙදා හැරීමට කටයුතු කර ඇත.

**06.** ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතිය සංවර්ධනය

මාර්ගගත Online රැකියා ගැළපීම,වෘත්තීය මාර්ගෝපදේශනය සහ පුහුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුව මගින් මාර්ගගත රැකියා සේවා පද්ධතියක් පවත්වාගෙන යන අතර ඉන් රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් අතර ඉහළ දායකත්වයක් පවතින සේවා වියුක්තිය අවම කිරීම බලාපොරොත්තු වේ.

2019 වර්ෂය තුළ මෙම මාර්ගගත පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍යමය දායකත්වය යටතේ,විශේෂ ව්‍යාපෘතියක් ලෙස නිර්මාණය කිරීම ආරම්භ කරන ලද අතර Freelancer සහ E-PES ,Mobile Apps සංවර්ධන කාර්යය මූලික වශයෙන් සිදු කරන ලදී.

<u>ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්ති ඒකකය</u>

මෙම ඒකකය මිනිස්බල සැලසුම්,සංවර්ධන හා පර්යේෂණ අංශය යටතේ ක්‍රියාත්මක වේ.2017 වර්ෂයේදී ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය හා සම්බන්ධව කරන ලද ප්‍රගතිය වර්තමාන රජයේ මධ්‍යකාලීන සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අනුකූලව නැවත සංශෝධනය කරන ලදී.එම සංශෝධිත ප්‍රතිපත්තිය සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ඇති අතර සියලුම අදාල අමාත්‍යාංශවල මධ්‍යකාලීන ක්‍රියාකාරී සැලසුම් අනුව ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාල සම්බන්ධීකරණය හා ප්‍රගති ඇගයුම් හා වාර්තාකරණය මෙම ඒකකය මගින් සිදු කරනු ලබයි.මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ සම සභාපතිත්වය කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේත් ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්තාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය යන අමාත්‍යාංශය දෙක මගින් දරන ලදී.


<u>ජාතික රැකියා කේන්ද්‍රය</u>

මෙම අංශය මිනිස්බල සැලසුම්,සංවර්ධන හා පර්යේෂණ අංශය යටතේ ක්‍රියාත්මක වේ. දිවයිනේ දිස්ත්‍රික්ක 25ක ම දිස්ත්‍රික් රැකියා කේන්ද්‍රය (Job Center / PES) ක්‍රියාත්මක වේ.ජාතික රැකියා කේන්ද්‍රය බත්තරමුල්ල කාර්යාල පරිශ්‍රයෙහි ස්ථාපිත කර ඇත.

රැකියා කේන්ද්‍ර ජාලය







ප්‍රධාන කාර්යාලය
9 වන මහල
සෙත්සිරිපාය දෙවන අදියර
බත්තරමුල්ල

දිස්ත්‍රික් රැකියා කේන්ද්‍රය මගින් සිදු කරනු ලබන කාර්යයන් වන්නේ ,

- රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම.
- පුරප්පාඩු සහ ආයතන ලියාපදිංචි කිරීම.
- ආයතනවල පුරප්පාඩු සොයා බැලීම සඳහා කටයුතු කිරීම.
- රැකියා අපේක්ෂිතයින්ගේ රැකියා පුරප්පාඩු පිළිබඳ ලේඛණ සකස් කිරීම.
- සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා රැකියා අපේක්ෂිතයින්ගේ සුදුසුකම් තහවුරු කර ගැනීම.
- රැකියා ගැලපීම් හා සම්මුඛ පරීක්ෂණ සඳහා යොමුකිරීම.
- රැකියා ගතකිරීම් හා පසුවිපරම්
- වෘත්තීය මාර්ගෝපදේශන සේවාවන් සැපයීම.
- පුහුණුව සඳහා පහසුකම් සැපයීම.
- රැකියා තත්ත්වයන් පිළිබඳව සංඛ්‍යා ලේඛණ රැස්කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.

- විදේශීය රැකියා අවස්ථා සඳහා මඟපෙන්වීම.
- දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහන සංවිධානය කර පැවැත්වීම.

රැකියා කේන්ද්‍ර ක්‍රියාවලිය







රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම ක්‍රම කිහිපයකට සිදුවේ. ප්‍රාදේශීය මට්ටමේ මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් විසින් හා රැකියා පොළවල්, රැකියා කේන්ද්‍ර මධ්‍යස්ථාන හරහා ලබා දෙන තොරතුරු මඟින් මෙම තොරතුරු ලබා ගැනේ.මේ යටතේ රැකියා අපේක්ෂිතයන් දැනුවත් කිරීමේ මූලික වැඩසටහන් සංවිධානය කෙරේ.


දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට මාර්ගගත (online) රැකියා සේවා රැකියා සේවා සැපයීමේ අන්තර්ජාල බිහිදොර මගින්ද රැකියා අපේක්ෂිතයන්ට හා ලියාපදිංචි විය හැකි අතර සේවා යෝජකයන් හටද මෙහි ලියාපදිංචි වී තම අවශ්‍යතා අනුව පුරප්පාඩු සඳහා රැකියා අපේක්ෂිතයන් තෝරා ගත හැක.(www.dome.gov.lk)


එසේම රැකියා අපේක්ෂිතයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය, පුහුණුව සඳහා යොමු කිරීම, Career Me ආයතනය විසින් පහසුකම් සපයන පෞරුෂත්ව සඳහා නොමිලේ පෙනී සිටීමට අවශ්‍ය පහසුකම් සපයා ඇත.මෙයට අමතරව විවිධ නිපුනතාවයක් සහිත වෘත්තකයන් සඳහා සිය සේවාවන් දෙපාර්තමේන්තු අන්තර්ජාල බිහිදොර මගින් ලියාපදිංචි වී ලබා දීමටත් එම සේවා අවශ්‍ය පිරිස සඳහා අන්තර්ජාලය මගින් තම පදිංචි ප්‍රදේශ අනුව සේවා සපයන්නන් තෝරා ගැනීමටත් අවස්ථාව සලසා ඇත.





ඉහත දැක්වූ මෙම සේවා ජංගම දුරකථන ආශ්‍රිත යෙදවුමක් (Mobile App.) මගින් ලබා ගැනීමටත් හැකියාව ඇතිවන පරිදි මෘදුකාංග සංවර්ධනය කර ඇත.උක්ත දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හා ඒ ආශ්‍රිත සංවර්ධනය පිළිබඳ කෙටි ව්‍යාපෘති දෙකක් සඳහා ලෝක කම්කරු සංවිධානය (ILO) මගින් අනුග්‍රහය දක්වා ඇත.




**<u>ජාතික රැකියා කේන්ද්‍රය මගින් 2019 වර්ෂයේදී පවත්වන ලද වැඩසටහන්</u>**

01. රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීමේ වැඩසටහන

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලියාපදිංචි වී සිටින රැකියා අපේක්ෂිතයින්ව දැනුවත් කිරීම මගින් ඔවුන් කැමති රැකියා ක්ෂේත්‍රය හඳුනාගැනීම හෝ අවශ්‍ය පුහුණු/උපදේශනවලට යොමු කිරීම මෙම වැඩසටහනෙහි අරමුණ වේ.

02. දිස්ත්‍රික් රැකියාපොළ වැඩසටහන

දිස්ත්‍රික්කය තුළ සිටින රැකියා අපේක්ෂිතයන් වෙනුවෙන් සංවිධානය කළ යුතු මෙම වැඩසටහන හරහා රැකියා සපයන ආයතන හා රැකියා අපේක්ෂිතයින් එකම ස්ථානයක දී හමුවීමට ඉඩහැරීම තුළින් සුදුසු රැකියා අවස්ථා හඳුනා ගැනීමටත් , සුදුසුකම් සපිරුණු තරුණ පිරිස් ආකර්ශනය කර ගැනීමටත් මඟ පාදාදෙනු ඇත. ඒ අනුව 2019 වර්ෂය තුල දී කෑගල්ල, මහනුවර , ගාල්ල ,මාතර , කුරුණෑගල , කිලිනොච්චි, පොළොන්නරුව සහ මොනරාගල දිස්ත්‍රික්ක තුල දී රැකියා පොළ වැඩසටහන් පවත්වන ලදී.

03. ව්‍යාපාරික සමුළු

දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර මූලික කරගනිමින් කරගෙන එම දිස්ත්‍රික් වල සේවා යෝජකයන්ගේ සමුළු සංවිධානය කර දෙපාර්තමෙන්තුවේ සේවාවන් හඳුනවා දීමේ වැඩසටහනකි. ඒ අනුව 2019 වර්ෂය සඳහා කෑගල්ල, මහනුවර ගාල්ල සහ වවුනියාව යන දිස්ත්‍රික්කයන්හිදී මෙම වැඩසටහන පවත්වන ලදී.

04. රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම

දිස්ත්‍රික්කය තුළ වෙසෙන සේවා වියුක්ති ජන කොට්ඨාශයෙන් රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කර දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම මෙමගින් සිදු කෙරේ.එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ප්‍රදේශය තුළ සිටින රැකියා අපේක්ෂිතයින් හඳුනාගෙන දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ලියාපදිංචි කිරීම , ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත මානව සම්පත් සංවර්ධන නිලධාරීන් විසින් සිදු කරනු ලැබේ.

05. රැකියා ඇබෑර්තු ලියාපදිංචිය.

මෙමඟින් දිස්ත්‍රික්කය තුළ පවතින පුද්ගලික හා අර්ධ පුද්ගලික ආයතනවල රැකියා ඇබෑර්තු සම්බන්ධ දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සිදු කරනු ලැබේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත සියලුදෙනා විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබෙන රැකියා ඇබෑර්තු ලියාපංදිචි කිරීමේ ඉලක්ක සම්පූර්ණ කරනු ලැබේ. දිස්ත්‍රික්ක තුළ විසිරී පවතින රැකියා සපයන ආයතන හා ඔවුන්ගේ ඇබෑර්තු වෙබ් අඩවිය තුළ ලියාපදිංචි කිරීම කරනු ලැබේ. එම පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මගින් ලියාපදිංචි කරන රැකියා අපේක්ෂිතයින් ගැළපීම සිදු කරනු ලැබේ.

06. රැකියාගත කිරිම

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලියාපදිංචි වී වෙබ් අඩවියට ඇතුළත් කරන ලද රැකියා අපේක්ෂිතයින්ගේ රැකියාගත කිරීම සිදුවන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් විසින් වෙබ් අඩවිය තුල ලියාපදිංචි කරන ඇබෑර්තු සමග ගැළපීමෙනි.

**07.** විශේෂ වැඩසටහන්

I. කම්කරු හා රැකීරක්ෂා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා උපදේශනාත්මක වැඩසටහන සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ දකුණු කොරියාව අතර **2019.07.15** දින ගිවිසුමකට එළඹෙන ලදී.







## <u>දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද විවිධ වැඩසටහන්</u>

**රැකියා නිර්මාණ , ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය මගින් පවත්වනු ලැබු පුහුණු වැඩසටන්හි ලබා ගන්නා ලද ඡායාරූප කිහිපයක්**

ගුරුවරු දැනුවත් කිරීමේ වැඩසටහන

කෑගල්ල



උපාධිධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන

කොළඹ විශ්වවිද්‍යාලය



අවශ්‍යතා මත පුහුණු වැඩසටහන
වැඩසටහන

කයිට්ස් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



උපාධිධාරීන් දැනුවත් කිරීමේ
වැඩසටහන

යාපනය විශ්වවිද්‍යාලය



අ.පො.ස.(උ.පෙළ) වැඩසටහන
පැල්මඩුල්ල ධර්මාලෝක මහා විද්‍යාලය



අ.පො.ස.(සා.පෙළ) වැඩසටහන
ගල්ගමුව වන්නිනායක විද්‍යාලය



ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන-
වැඩසටහන
කුරුණෑගල ගැට්ටුවාන මහින්ද විද්‍යාලය
කාර්යාලය



රැකියා අපේක්ෂිතයන් දැනුවත්කිරීමේ

සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම්



රැකියා අපේක්ෂිතයන් දැනුවත්කිරීමේ වැඩසටහන

තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



මොණරාගල දිස්ත්‍රික් රැකියා පොළ



දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන

බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන

මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



අවශ්‍යතා මත පුහුණු වැඩසටහන

මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය





ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන

මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන

ඇළහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය






8.2 දිස්ත්‍රික් රැකියා කේන්ද්‍රය මගින් **පවත්වනු ලැබූ වැඩසටහන්හි ලබා ගන්නා ලද ඡායාරූප කිහිපයක්**

ගාල්ල දිස්ත්‍රික් රැකියා පොළ









02. කෑගල්ල දිස්ත්‍රික් රැකියා පොළ





කිලිනොච්චි දිස්ත්‍රික් රැකියා පොළ





ලක් රැකියා හරසර වැඩසටහන











## 1.6 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

සෘජුව විදේශ ආධාර ලබන ව්‍යාපෘති අප දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක නොවේ.

# පරිච්ඡේදය 02

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 ප්‍රගතිය

| | වැඩසටහන/ක්‍රියාකාරකම | 2019 වසර සඳහා වූ ඉලක්ක | | 2019/01/01 දින සිට 2019/12/31 දක්වා ප්‍රගතිය | | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය (රු.මි) | භෞතික | මූල්‍ය (රු.මි) | |
| රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය | | | | | | |
| 1 | අ.පො.ස සාමාන්‍ය පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 1865 | 1.100 | 2023 | 1.180 | 58,455 |
| 2 | අ.පො.ස උසස් පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 1328 | 1.240 | 1289 | 1.304 | 40,108 |
| 3 | ස්වයං රැකියා පෙළඹවීම් වැඩසටහන | 311 | 0.777 | 407 | 0.714 | 14,329 |
| 4 | වෘත්තීය අභියෝග ජය ගැනීම | 50 | 0.275 | 53 | 0.227 | 2,108 |
| 5 | උපාධි අපේක්ෂිතයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන අභ්‍යන්තර /බාහිර | 15 | 0.567 | 11 | 0.408 | 459 |
| 6 | ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 15 | 0.428 | 24 | 0.379 | 901 |
| 7 | දෙමාපියන්දැනුවත් කිරීමේ වැඩසටහන | 311 | 0.817 | 435 | 0.808 | 20,437 |
| 8 | හසර සඟරාවමුද්‍රණය | 2 | 0.360 | 2 | 0.344 | - |
| 9 | ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 20 | 0.455 | 26 | 0.485 | 798 |
| 10 | ප්‍රාදේශීය රැකියා පොළ වැඩසටහන | 120 | 0.840 | 129 | 1.038 | 13,943 |
| 11 | අවශ්‍යතාමත පුහුණු වැඩසටහන | 200 | 1.400 | 172 | 0.972 | 4,874 |
| 12 | උද්‍යාන අලංකරණ වැඩසටහන | 3 | 0.110 | 3 | 0.100 | 103 |
| 13 | ලක් රැකියාහරසර වැඩසටහන - I | 100% | 2.000 | 100% | 1.703 | - |
| | ලක් රැකියා හරසර වැඩසටහන - සුනිසි මෙහෙවර | 100% | 1.000 | 100% | 0.609 | - |
| මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ අංශය | | | | | | |
| 14 | ආංශික අධ්‍යයනයන් - Sectoral Studies | 26 | 0.400 | 23 | 0.087 | - |
| 15 | මාසික වාර ප්‍රකාශන - Monthly LMI Newsletter | 5 | 0.200 | 4 | 0.114 | - |
| 16 | ශ්‍රම වෙළඳපොළ තොරතුරු තැටිය (bulletin CD) | 100% | 0.130 | 100% | 0.085 | - |
| 17 | ශ්‍රම වෙළඳපොළ තොරතුරු සඟරාව Annual LMI Bulletine | 100% | 0.200 | 100% | 0.202 | - |
| 18 | ශ්‍රම වෙළඳපොළ සම්මේලනය ( LMI forum) | 100% | 0.030 | 45% | - | - |
| 19 | සමාජ ආර්ථික දත්ත අත්පොත (Socio - Economic Data Hand book) | 100% | 1.000 | 100% | 0.795 | - |
| 20 | Development of LMIS | 100% | 1.000 | 85% | 0.873 | - |
| 21 | Periodic Reports on demand | 100% | | 20% | | - |

| | වැඩසටහන/ක්‍රියාකාරකම | 2019 වසර සඳහා වූ ඉලක්ක | | 2019/01/01 දින සිට 2019/12/31 දක්වා ප්‍රගතිය | | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය (රු.මි) | භෞතික | මූල්‍ය (රු.මි) | |
| | | | 0.040 | | - | |
| **<u>මහජන රැකියා සේවාමධ්‍යස්ථානය</u>** | | | | | | |
| 22 | දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම හා ආරම්භ කිරීම | 3 | 0.750 | 1 | 0.232 | - |
| 23 | දිස්ත්‍රික් රැකියා පොළ පැවැත්වීම | 12 | 1.750 | 11 | 1.891 | 11,935 |
| 24 | රැකියා අපේක්ෂිතයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 300 | 1.500 | 408 | 1.357 | 16,865 |
| 25 | මහජන රැකියා සේවා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම | | | | | |
| | 1.රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම | 100,000 | | 90,550 | | 90,550 |
| | 2.රැකියා පුරප්පාඩු ලියාපදිංචි කිරීම | 39,600 | 0.450 | 38,689 | 0.644 | 38,689 |
| | 3.රැකියා ගැලපීම | | | 31,343 | | 31,343 |
| | 4.රැකියා ගතකිරීම | 27,580 | | 14,832 | | 14,832 |
| 26 | හාම්පුතුන් සමඟ කතිකාවත - Conducting of Employer Forums | 8 | 0.400 | 4 | 0.155 | 159 |
| 27 | WAPES Membership -ලෝක මහජන රැකියා සේවා සංගමය | 100% | 0.650 | | 0.503 | - |
| 28 | අවශ්‍යතාවය අනුව පවත්වන විශේෂ වැඩසටහන් Tailormade Programmes for Companies and Job Seekers | 25 | 0.500 | 14 | 0.586 | 515 |
| **<u>කළමනාකරණ තොරතුරු පද්ධතිය - MIS</u>** | | | | | | |
| 29 | තෝරාගත් දිස්ත්‍රික්ක සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් වෙනුවෙන් ලැප්ටොප් යන්ත්‍ර මිලදී ගැනීම | 100% | 3.000 | 100% | 3.000 | - |
| **<u>සුනිසි මෙහෙවර</u>** | | | | | | |
| 30 | පූජාකටයුතු සඳහා යොදා ගන්නා මල් වගා කිරීම,මල් මාලා සැකසීම හා අලෙවි කිරීමේ ව්‍යාපෘතිය - කතරගම | 100% | 1.230 | 80% | 0.748 | 266 |
| 31 | ජාතික මානව සම්පත් රැකියා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම - තොරතුරු තාක්ෂණ පද්ධතිය නඩත්තු කිරීම. | 100% | 0.530 | 100% | 0.513 | - |
| 32 | මහනුවර දිස්ත්‍රික් රැකියා කේන්ද්‍රය ස්ථාපිත කිරීම | 100% | 0.970 | 100% | 0.949 | - |
| 33 | අත්පොත් මුද්‍රණය | 100% | 0.641 | 100% | 0.483 | - |

රැකියාගත කිරීම් 2019/12/31 දක්වා ප්‍රගතිය

| | දිස්ත්‍රික්කය | සෘජුරැකියා ගත කිරීම | | ස්වයංරැකියාලාභින්/ව්‍යවසායකයින් බිහි කිරීම |
|---|---|---|---|---|
| | | දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර මගින් | ප්‍රාදේශීයලේකම් කාර්යාල මට්ටමින් | |
| 1 | කොළඹ | 765 | 384 | 212 |
| 2 | ගම්පහ | 332 | 406 | 72 |
| 3 | කළුතර | 304 | 603 | 221 |
| 4 | මහනුවර | 374 | 403 | 97 |
| 5 | මාතලේ | 121 | 290 | 31 |
| 6 | නුවරඑළිය | 42 | 135 | 51 |
| 7 | ගාල්ල | 250 | 344 | 165 |
| 8 | මාතර | 422 | 475 | 140 |
| 9 | හම්බන්තොට | 375 | 494 | 52 |
| 10 | යාපනය | 475 | 449 | 155 |
| 11 | මන්නාරම | 44 | 139 | 77 |
| 12 | වවුනියාව | 122 | 62 | 27 |
| 13 | මුලතිව් | 4 | - | 11 |
| 14 | කිලිනොච්චිය | 381 | 91 | 50 |
| 15 | මඩකලපුව | 107 | 951 | 303 |
| 16 | අම්පාර | 62 | 345 | 228 |
| 17 | ත්‍රිකුණාමලය | 109 | 67 | 91 |
| 18 | කුරුණෑගල | 603 | 1095 | 317 |
| 19 | පුත්තලම | 156 | 400 | 71 |
| 20 | අනුරාධපුරය | 227 | 130 | 198 |
| 21 | පොළොන්නරුව | 125 | 43 | 22 |
| 22 | බදුල්ල | 528 | 257 | 48 |
| 23 | මොණරාගල | 66 | 120 | 35 |
| 24 | රත්නපුර | 230 | 422 | 113 |
| 25 | කෑගල්ල | 135 | 368 | 58 |
| | එකතුව | 6359 | 8473 | 2845 |

| | |
|---|---|
| රැකියා ගත කිරීම - දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර මගින් | 6359 |
| රැකියා ගත කිරීම - ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් | 8473 |
| ස්වයං රැකියාලාභීන් බිහි කිරීම | 2845 |
| මුළු රැකියාගත කිරීම | 17,677 |

දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහනෙහි ප්‍රගතිය -2019

| | දිස්ත්‍රික්කය | ස්ථානය | පවත්වන ලද දිනය | රැකියා අපේක්ෂිතයන් ගණන | සහභාගි වූ ආයතන ගණන | පුහුණු ආයතන ගණන | රැකියා ගත කිරීම | රැකියා ගැලපීම | පුහුණුව සඳහා යොමු කිරීම | වියදම (රු) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | කෑගල්ල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල | 2019/03/09 | 2234 | 65 | 7 | 285 | 1267 | 85 | 131,584 |
| 02 | මහනුවර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර | 2019/03/31 | 2454 | 45 | 18 | 176 | 1391 | 511 | 161,024 |
| 03 | ගාල්ල | හෝල් දි ගෝල් | 2019/06/22 | 825 | 41 | 9 | 83 | 1580 | 61 | 140,674 |
| 04 | මාතර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර | 2019/06/29 | 1748 | 37 | 6 | 257 | 1409 | 307 | 146,220 |
| 05 | කුරුණෑගල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල | 2019/07/27 | 1206 | 25 | 6 | 154 | 679 | 169 | 156,585 |
| 06 | කිලිනොච්චි | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කිලිනොච්චි | 2019/09/03 | 1115 | 23 | 4 | 358 | 651 | 40 | 399,293 |
| 07 | පොළොන්නරුව | තෝපාවැව මහා විද්‍යාලය - පොළොන්නරුව | 2019/09/21 | 1400 | 29 | 12 | 369 | 399 | 383 | 329,770 |
| 08 | මොණරාගල | ප්‍රජා ශාලාව - මොණරාගල | 2019/09/27 | 953 | 17 | 17 | 37 | 279 | 152 | 371,613 |
| | එකතුව | | | 11935 | 282 | 79 | 1719 | 7655 | 1708 | 1,836,763 |

සේවා යෝජකයන් සමග පවත්වන ලද විශේෂ වැඩසටහන්

| දිනය | ස්ථානය | සහභාගීත්වය (ආයතන සංඛ්‍යාව) | වැයශිර්ෂය | වියදම රු. |
|---|---|---|---|---|
| 2019-02-07 | කෑගල්ල | 42 | 2-2509 | 40,000.00 |
| 2019-03-12 | මහනුවර | 48 | 2-2509 | 40,000.00 |
| 2019-04-04 | ගාල්ල | 31 | 2-2509 | 40,000.00 |
| 2019-08-08 | වව්නියාව | 38 | 2-2509 | 35,300.00 |

මේ මගින් සේවා යෝජකයන් හා දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර හා ජාතික රැකියා කේන්ද්‍ර අතර එනම් සමස්ථයක් වශයෙන් දෙපාර්තමේන්තුවත්, දෙපාර්තමේන්තුවේ සේවය සැපයිය හැකි සේවා යෝජකයන් අතරත් යහපත් සම්බන්ධතාවයක් ඇති කර ගැනීම මගින් රැකියා සේවා ලබා ගැනීම හා සැපයීම අනයෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ සලසා ගැනීම මෙහි මූලික අරමුණ වේ.

## විශේෂ වැඩසටහන් වල ප්‍රගතිය

ලක් රැකියා හරසර වැඩසටහන



මෙහිදී තරුණ රැකියා අපේක්ෂිතයන් සඳහා රැකියා ලබා දීම හා අනෙකුත් පහසුකම් සැපයීම සම්බන්ධව පළාත් 9 නියෝජනය වන පරිදි තෝරාගත් දිස්ත්‍රික්ක 9ක සේවා යෝජකයන්, එනම්,මඩකලපුව,හම්බන්තොට,මහනුවර,කෑගල්ල,කිලිනොච්චිය,මොණරාගල,පොළොන්නරුව,පුත්තලම හා ගම්පහ දිස්ත්‍රික්කයන්හි විවිධ ව්‍යවසායකයින් ඇගයීමට ලක් කරනලදි.

මෙහිදී නිෂ්පාදන,සේවා,කෘෂිකර්ම හා ස්වයං රැකියා වශයෙන් සේවා යෝජකයන් විශේෂ නිර්ණායක ඔස්සේ ඇගයීමට ලක් කර රන්, රිදී,ලෝකඩ සම්මාන ප්‍රදානය කරන ලදි.

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකය දිස්ත්‍රික් රැකියා කේන්ද්‍රයයි. ඒ සමඟ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල නිරන්තරව අන්‍යෝන්‍යව සම්බන්ධ වී ජාතික රැකියා සේවයට අදාල කටයුතු ඉටු කරමින් පවතී. දිවයිනේ සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල කේන්ද්‍ර කොට ගනිමින් දැනට දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර එනම් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන 25ක් ක්‍රියාත්මක වේ. ලක් රැකියා හරසර වැඩසටහන තුලදී එම මධ්‍යස්ථාන හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල කාර්යසාධනය එනම් රැකියා අපේක්ෂිතයන් රැකියා ගත කරවීම ප්‍රමුඛ කොට ගෙන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කයන් ලඟා කර ගැනීම පිළිබඳව සලකා ශ්‍රේණිගත කිරීම් සිදු කරදිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර 25 ම ඇගයීමට ලක් කර රන්,රිදී,ලෝකඩ සම්මාන ප්‍රදානය කරන ලදි. මෙහිදී රන් සම්මානය යාපනය දිස්ත්‍රික් කණ්ඩායමත්, රිදී සම්මානය කුරුණෑගල දිස්ත්‍රික් කණ්ඩායමත් ලෝකඩ සම්මානය මඩකලපුව දිස්ත්‍රික් කණ්ඩායමටත් හිමි විය.

**කොරියානු රාජ්‍ය ත්‍රාන්තික මැදිහත් වීම මත සේවා නියුක්තිය හා ශ්‍රම වැඩසටහන් පිළිබඳ ප්‍රතිපත්ති උපදේශන වැඩසටහන**

මෙම ක්‍රියාවලිය ප්‍රතිපත්ති උපදේශන ක්‍රියාවලියකි.(Policy consultation Programe)එය කොරියානු කම්කරු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත ආයතනයක් වන KEIS–Korean Employment Information Service ආයතනය මගින් සිදු කෙරේ.මෙවර 2019 සංචාරයේදී දෙපාර්තමේන්තුවට අවශ්‍ය Employment sourcing and delivery ක්‍රමවේදය සඳහා වූ පූර්ව ශක්‍යතා අධ්‍යයනයේ ප්‍රතිඵල ඔවුන් විසින් ඉදිරිපත් කරන ලදි.ඒ අනුව එම ව්‍යාපෘතිය මධ්‍යස්ථ අවධානම් සහිත ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇත.ඒ අනුව එම නියෝජිත කණ්ඩායම විසින් සිය අමාත්‍යාංශය වෙත කරුණු ඉදිරිපත් කර 2020 හා ඉන් ඉදිරියට යෝජිත ශක්‍යතා අධ්‍යයනය සඳහා අනුමැතිය ලබා ගත යුතුව ඇත.එසේ අනුමැතිය ලබා ගත් පසු සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.

**ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම**

මෙම ඒකකය යටතේ අමාත්‍යාංශය වලින් ප්‍රගතිය ලබා ගැනීමට සකස් කරන ලද පරිගණක මෘදුකාංගය ICT based progress Monitoring System නැවත ක්‍රියාත්මක කරන ලදි.2019.01.01 දින ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සෘජුව සම්බන්ධිත යැයි හඳුනාගත් අමාත්‍යාංශ 25 න් ප්‍රතිපත්තිය ඉදිරියට ක්‍රියාත්මක කිරීම පිළිබඳ මෙම ක්‍රියාදාමය ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු,නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන,උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය යන අමාත්‍යාංශය හා එවකට කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ සම සභාපතිත්වයෙන් සිදු කරන ලදි.එහිදී තෝරා ගත් ප්‍රතිපත්ති 5 ක් හෝ 6ක් සඳහා ප්‍රතිපත්ති මට්ටමේ ක්‍රියාකාරකම් හඳුනා ගැනීමට ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාලව අමාත්‍යාංශ විසින් ප්‍රතිපත්ති සම්පාදන නියෝජිත - Focal point ,බලාත්මක කිරීමේ නිලධාරී - Authorization officer දත්ත කැවීමේ නිලධාරී - Data Entry officer යන මට්ටම් 3ක් තෝරා ගන්නා ලදි. මෙහි අමාත්‍යාංශ සම්බන්ධීකරණය ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු අමාත්‍යාංශය,නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන,උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය යන අමාත්‍යාංශය මගින් සිදු කරන ලදි.

එසේම, මෙම ඒකකය මගින් කෘෂිකර්මය,සෞඛ්‍යය හා විගමණික සේවකයන් පිළිබඳ ආංශික අධ්‍යයනය සිදුකිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලදි. මේ සඳහා දළ නිර්ණායක -TOR පූර්ව වශයෙන් සකස් කරන ලදි.ඉන්පසු ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර තාක්ෂණික ඇගයුම් කමිටුව විසින් අවසාන නිර්ණායක සකස් කරන ලදි.පුවත් පත් දැන්වීමක් මගින් අධ්‍යයනය සිදු කිරීමට සුදුසු පාර්ශවයන්ගෙන් අභිමතය කැඳවන ලදි.ඒ අනුව තාක්ෂණික ඇගයුම් කමිටුවේ නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර නිර්දේශිත අයදුම්කරුවන් ඉදිරිපත් කර ඇති ලංසු සැලකූ විට වෙන් කල ඇති ප්‍රතිපාදන

ප්‍රමාණවත් නොවන අතර 2020 වසරේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

**පූජා කටයුතු සඳහා යොදා ගන්නා මල් වගා කිරීම,මල් මාලා සැකසීම හා අලවි කිරීමේ ව්‍යාපෘතිය - කතරගම**

**කතරගම පූජා භූමිය ආශ්‍රිතව කතරගම කිරිවෙහෙර,කතරගම දේවාලය,සෙල්ලකතරගම ගණ දෙවි දේවාලය හා වැඩසිටි කන්ද යන ආගමික ස්ථාන රාශියක් පවතී.එහි වන්දනාවේ පැමිණෙන බැතිමතුන් සඳහා අවශ්‍ය මල් අවශ්‍යතාවයන් සැපිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.**

කතරගමට පැමිණෙන බැතිමතුන් කතරගම දේවාලයට හා අනෙකුත් දේවාලවලට පූජා වට්ටියක් පූජා කිරීම සිදු කරයි. මෙම පූජා වට්ටියට "මල් මාලාවක්" තැබීම සිරිතක්ව පවතී.මෙම මල්මාලාව පොලිතීන් වලින් සතසා තිබේ.මෙම පොලිතීන් උපයෝගී කරගෙන තැනූ මල් මාලා භාවිතය විශාල පරිසර බලපෑමක් ඇති කරන්නක් බවට පත්ව ඇත. එම නිසා මෙම පොලිතීන් මල් මාලට වෙනුවට ස්වාභාවික මල් මාලයක් යොදා ගැනීම කාලෝචිත කටයුත්තක් ලෙස සැලකිය හැක.

මෙම ව්‍යාපෘතිය සැකසෙන්නේ පූජා භූමිය ආශ්‍රිතව පවතින මල් පූජා කිරීමේ අවශ්‍යතාවය සැපිරීම හා පොලිතීන් මල් මාලා වෙනුවට ස්වාභාවික මල් මාලා සැපයීම අරමුණු කොටගෙනය. මෙහිදී මල් වගාව (තවාන් පාලනය ඇතුළුව) මල් මාලා සැකසීම හා අලෙවිය සිදුවේ.

මෙහිදී මල් වගාකරුවන්, මල් වෙළෙන්දන්, අතරමැදියන් හා අමු ද්‍රව්‍ය සපයන්නාන් සඳහා රැකියා අවස්ථා ජනිත වේ.

## 2.2 අභියෝග හා ඉදිරි ඉලක්ක

- දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන අඩු ප්‍රතිපාදන තුලින් වඩාත් ගුණාත්මක සේවයක් මහජනතාවට ලබා දීමේ ගැටළුව මෙන්ම රජයේ රෙගුලාසී හා චක්‍රලේඛ වලට අනුගතව මෙම ක්‍රියාමාර්ග ගත යුතු බැවින් වඩා මානුෂීය සේවයක් මහජනතාවට ලබා දීම ද දෙපාර්තමේන්තුව සතුව ඇති අභියෝගයකි.
- තාක්ෂණික මෙවලම් භාවිතයේ ඇති අඩු නැමියාව හා එම මෙවලම් දෙපාර්තමේන්තුව සතුව නොතිබීම.
- දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් බහුතරය උපාධිධාරීන් වන අතර ඔවුන් වැඩි වශයෙන් ගම්පහ, කොළඹ, මාතර , ගාල්ල, කුරුණෑගල යන ප්‍රධාන දිස්ත්‍රික්කයන්හි පදිංචිකරුවන් වන බැවින් දුෂ්කර ප්‍රදේශයන්හි පුරප්පාඩු සඳහා නිලධාරීන් අනුයුක්ත කර ගැනීම දුෂ්කර වී ඇත.
- දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යන් වන වෘත්තීය මාර්ගෝපදේශනය ,රැකියා නිර්මාණ හා ප්‍රවර්ධනය, රැකියා සේවා සම්බන්ධීකරනය,මිනිස්බල සැලසුම්කරණය , විරැකියාව අවම කිරීමට වන අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සංවිධානය කර පැවැත්වීම. රැකියා යෝග්‍යතා සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම හා රැකියා හා අදායම් උත්පාදන විශේෂ ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කිරීම යන කාර්යයන් එම සේවාවන් අත්‍යාවශ්‍ය දුෂ්කර ප්‍රදේශ සඳහා ලබා දීමේදී එම ප්‍රදේශ සඳහා නිලධාරීන් හිඟ වීම තුල ගැටළු පැවතීම.
- සමාජමය ආකල්ප හා සමාජයේ පවතින ව්‍යුහාත්මක ගැටළු හේතුවෙන් වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම් සිදු කලද ආකල්පය වෙනසක් ජනතාව තුල ඇති කිරීමේ දුෂ්කරතාවය.

# පරිච්ඡේදය 03

# වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3 වනපරිච්ඡේදය -2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ- එෆ්

2019.12.31 දිනෙන් අවසන් වූ කාලසීමාව සඳහා වන
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

| අයවැය 2019 | | සටහන | තත්‍ය 2019 | 2018 |
|---|---|---|---|---|
| | ආදායම්ලැබීම් | | | |
| | ආදායම්බදු | 1 | | |
| | දේශිය භාණ්ඩ හා සේවා ම තබදු | 2 | | |
| | අන්තර් ජාතික වෙළඳාම මත බදු | 3 | | |
| | බදු නොවන ආදායම් සහ වෙනත් | 4 | | |
| | මුළු ආදායම් ලැබීම් (අ ) | | | |
| | ආදායම් නොවන ලැබීම් | | | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 358,050,000 | 345,036,726 |
| | තැන්පතු | | 798,025 | 207,404 |
| | අත්තිකාරම් ගිණුම් | | 15,848,315 | 13,908,338 |
| | වෙනත් ලැබීම් | | 16,195,573 | 14,487,377 |
| | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 390,891,913 | 373,639,845 |
| | මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම්ඇ=((අ)+(ආ) | | 390,891,913 | 373,639,845 |
| | අඩුකළා . වියදම | | | |
| | පුනරාවර්තන වියදම් | | | |
| 311,000,000 | වේතන,වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 300,751,505 | 279,033,954 |
| 67,100,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 65,313,123 | 45,637,119 |
| 8,700,000 | සහනාධාර සහනාධා රප්‍රදාන සහ මාරුකිරිම් | 7 | 8,171961 | 7,995,916 |
| | පොළි ගෙවීම් | 8 | | |
| 200,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 161,548 | 196,985 |
| 387,000,000 | මුළු පුනරාවර්තන වියදම් (ඇ) | | 374,398,137 | 332,863,974 |
| | මූලධන වියදම් | | | |
| | මූලධන වත්කම් | | | |

| | | | | |
|---|---|---|---|---|
| 3,000,000 | පුරරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 1,543,980 | 1,062,062 |
| 1,500,000 | මූලධන වත්කම් අත්පත් කරගැනීම | 11 | 796,130 | 849,976 |
| | ප්‍රාග්ධන පැවරීම් | 12 | | |
| | මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම | 13 | | |
| 4,500,000 | හැකියා වර්ධනය | 14 | 2,466,304 | 3,802,829 |
| 26,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 20,627,469 | 16,988,758 |
| 35,000,000 | මුළු මූලධන වියදම් (ඉ) | | 25,433,883 | 22,703,625 |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඊ) | | 15,586,182 | 18,072,049 |
| | තැන්පතු ගෙවීම | | 762,030 | 384,251 |
| | ආදායම් ගෙවීම් | | 311,641 | |
| | අත්තිකාරම් ගෙවීම් | | 14,512,511 | 17,687,798 |
| | මුළු වියදම උ(ඈ+ඉ+ඊ) | | 415,418,202 | 373,639,648 |
| | 2019දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඈ-උ) | | (24,526,286) | 197 |

## 3.2මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ- පී

**2019** දෙසැම්බර් **31** දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය | |
|---|---|---|---|
| | | **2019** රු. | **2018** රු. |
| මූල්‍ය නොවන වත්කම් | | | |
| දේපළ පිරියත හා උපකරණ | ඒසිඒ **-6** | **76,520,773** | **70,978,466** |
| මූල්‍ය වත්කම් | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසිඒ- **5**ය | **39,379,976** | **40,422,056** |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසිඒ- **3** | | |
| **මුළු වත්කම්** | | **115,900,749** | **111,400,522** |
| ශුද්ධවත්කම් **/**ස්කන්ධය | | | |
| ශුද්ධවත්කම් | | **39,010,682** | **40,346,642** |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | **76,520,773** | **70,978,466** |
| කුලි හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසිඒ**-5(**ආ**)** | | |
| ජංගම වගකීම් | | | |
| තැන්පතු ගිණුම් | ඒසිඒ**-4** | **111,212** | **75,217** |
| අග්‍රිම ශේෂය | ඒසිඒ**-3** | **258,082** | **197** |
| මුළු වගකීම් | | **115,900,749** | **111,400,522** |
| | | | |

පිටුඅංක **01** සිට **28** දැක්වෙන ඉහත ඒසිඒ **1** සිට ඒසිඒ **6** දක්වා වූ ආකෘතිපත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක **29** සිට **36** දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තරද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා ර්ට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කරඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත්මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය :
2020/2/18

ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය :
Director General
Department of Manpower & Employment
9th Floor, Sethsiripaya - Stage II
Battaramulla.

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2020/2/14

3

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලවර්ෂය සඳහා වන**
**මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

| | සතය | |
|---|---|---|
| | **2019** | **2018** |
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | _ |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | 1,419,674 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 15,883,932 | - |
| වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මගින් එකතු කරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම් | 358,050,000 | 344,200,000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **373,933,932** | **345,619,674** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 366,226,176 | 311,800,355 |
| සහනාධාර සහ මාරුකිරීම් | 8,171,961 | 7,995,916 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 3,317,353 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 1,102 | 197 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **377,716,592** | **319,796,468** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)** | **(3,782,660)** | **25,823,206** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල්ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම්විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | 15,848,315 | 13,908,338 |

| | | |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **15,848,315** | **13,908,338** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත්ආයෝජන අත්කර ගැනීම් | 25,433,883 | 22,703,625 |
| අත්තිකාරම් ගෙවීම් | 14,512,511 | 17,687,799 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල්ප්‍රවාහය (ඉ)** | **39,946,394** | **40,391,424** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල්ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(24,098,079)** | **(26,483,086)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඈ) + (ඊ)** | **(27,880,739)** | **(659,880)** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල්ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | 836,726 |
| තැන්පතු ලැබීම් | 798,025 | 207,404 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල්ප්‍රවාහය (ඌ)** | **798,025** | **1,044,130** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 762,030 | 384,251 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල්ප්‍රවාහය (එ)** | **762,030** | **384,251** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **35,995** | **659,879** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)** | **(27,844,744)** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **258,082** | **-** |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ %ලෙස |
| **අදාලනොවේ.** | | | | | |

## 3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගි කරගැනීමේ කාර්යසාධනය

**රු.000**

| ප්‍රතිපාදන වර්ගය | වෙන්කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මූල්‍ය ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | **387,000** | **387,000** | **374,398** | **96** |
| ප්‍රාග්ධන | **35,000** | **27,775** | **25,433** | **92** |

## 3.7මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| 01 | කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාශය | සුනිසි මෙහෙවර සඳහා වැය දැරීම | 3,730 | 4,371 | 3,224 | 74 |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු,000

| වත්කම්කේතය | කේත විස්තරය | 31.12.2019දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2019 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුවශේෂය | ඉදිරියේදි ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යූහයන් | | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 76,520 | 76,520 | | 100 |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීවවිද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යනවැඩ | | | | |
| 9180 | බදු දෙන ලදව ත්කම් | | | | |

## **3.**9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

2019 වර්ෂයට අදාල විගණකාධිපති වාර්තාව ඇමුණුම්හි ඇතුලත් කර ඇත.

# පරිච්ඡේදය 04

# කාර්ය සාධන දර්ශක

## 04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%)ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% -90% | 75% - 89% | 50% - 74% |
| රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචිය | 90.55% | | |
| ඇබෑර්තු ලියාපදිංචිය | 97.69% | | |
| රැකියා ගත කිරීම | | | 53.77% |
| පාසැල් සිසුන් සඳහා සිදු කරන වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ගණන | 103.72% | | |
| ස්වයං රැකියා පෙළඹවීමේ වැඩසටහන් ගණන | 130.86% | | |
| ස්වයං රැකියා හා ව්‍යවසාය ආරම්භ කිරීම | | 87.26% | |

# පරිච්ඡේදය 05

# තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්කය /අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% -49% | 50% - 74% | 75% -100% |
| තිරසර සංවර්ධන අරමුණු 4 - පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම | ඉලක්කය 4.3. 2030 වන විට සියලුම කාන්තාවන්ට හා පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද ඇතුලත්ව තාක්ෂණික,වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වීම | 2019 වසරේදී සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටින සිසුන්ගෙන් 20% කට වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම | | | 94.89% |
| | | 2019 වසරේදී උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටින සිසුන්ගෙන් 20% කට වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම | | | 91.99% |
| | | 2019 වසරේදී දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් වසරකට දිපව්‍යාප්තව 311ක් පැවැත්වීම | | | 139% |
| | ඉලක්කය 4.4. 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් | 2019 වසරේදී ස්වයං රැකියා පෙළඹවීම් වැඩසටහන් 311 ක් | | | 130.86% |

| ඉලක්කය /අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% -49% | 50% - 74% | 75% -100% |
| | සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම | පැවැත්වීම. | | | |
| | | 2019 වසර තුල දීපව්‍යාප්තව ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 20 ක් පැවැත්වීම | | | 130% |
| | | 2019 වසර තුල ව්‍යවසායකත්ව අවශ්‍යතා මත පුහුණු වැඩසටහන් 200ක් දීපව්‍යාප්තව පැවැත්වීම. | | | 86% |
| තිරසර සංවර්ධන අරමුණු 8 - සියල්ලන් සඳහාම පෝෂිත,පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය , පූර්ණ ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධන කිරීම | ඉලක්කය 8.5 2030වන විට ආබාධිත පුද්ගලයන් සහ යෞවනයන් ද ඇතුලත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායි හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම | 2019 වසර තුල රැකියා අපේක්ෂිතයන් 100,000 ලියාපදිංචි කිරීම | | | 90.55% |
| | | 2019 වසර තුල රැකියා ඇබෑර්තු 39,600ක් ලියාපදිංචි කිරීම. | | | 97.69% |
| | | 2019 වසර තුල රැකියා අපේක්ෂිතයන් 27,580 ක් රැකියාගත කිරීම | | 53.77% | |
| | | 2019 වසර තුල ව්‍යවසායකයින් හා ස්වයංරැකියාලාභීන් 3260 ක් බිහි කිරීම | | | 87.26% |

| ඉලක්කය /අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% -49% | 50% - 74% | 75% -100% |
| | | 2019 වසර තුල රැකියා අපේක්ෂිතයන් 40,300 සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සිදු කිරීම | | | 101.59% |
| | | 2019 වසර තුල රැකියා අපේක්ෂිතයන් 16,390ක් පුහුණුව සඳහා යොමු කිරීම | | | 91.79% |

## 5.2තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින්

අභියෝග

1. එකම කාර්යය සඳහා විවිධ දෙපාර්තමේන්තු ගත නිලධාරීන් එකම ප්‍රතිලාභීන් පිරිසක් සඳහා සේවා සැපයීමේදී වන ද්වීකරණය හා නිලධාරීන් අතර ඇතිවන රාජකාරීමය අවබෝධතාවයන්ගේ විෂමතාවය
2. වෘත්තීය මාර්ගෝපදේශන, රැකියා නිර්මාණ ,ප්‍රවර්ධන කටයුතු සඳහා වාර්ෂිකව මධ්‍යකාලීන අයවැය ප්‍රතිපාදන යටතේ වෙන්වන ප්‍රතිපාදන සීමිත වීම මත පුළුල්ව සේවා සැපයීමට හා සේවා ගුණාත්මය පවත්වා ගැනීමට ඇති වන දුෂ්කරතාවය
3. සියලුම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හට තොරතුරු තාක්ෂණ පහසුකම් හා ප්‍රගති ඇගයුම් කළමනාකරණ තොරතුරු පද්ධතියක් නොමැති වීම හා මේ සඳහා සකස් කරන ලද ව්‍යාපෘතිය සඳහා ඉතා සීමිත ලෙස ප්‍රතිපාදන නිදහස් වීම. මේ මත දිවයිනේ සියලුම නිලධාරීන් පොදු ක්‍රියාකාරී වේදිකාවක් මතට ගෙන ඒම අපහසු වීම
4. නිලධාරීන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා නිරන්තරයෙන් සංවර්ධනය සඳහා ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම

# පරිච්ඡේදය 06

# මානව සම්පත් පැතිකඩ

## මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය - 2019.12.31 දිනට

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු /(අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 15 | 6 | 9 |
| තෘතීයික | 4 | 0 | 4 |
| ද්විතීයික | 673 | 569 | 104 |
| ප්‍රාථමික | 15 | 13 | 02 |

### 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම

ඉහත වගුව අනුව, විධායක මට්ටමේ තනතුරු **15** කින් 9ක්ම පුරප්පාඩුව පවතින අතර මින් පුරප්පාඩු තනතුරු **0**7ක්ම ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතරු සඳහා වේ. මෙම පුරප්පාඩු සම්පූර්ණ කරදෙන මෙන් **2016** වර්ෂයේ සිට ඉල්ලීම් සිදුකර ඇති අතර රාජ්‍ය පරිපාලන ලේකම් හා පැවති සාකච්ඡා කිහිපයකදීම , මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා පත්කිරීම් කඩිනමින් සිදුකර ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දුන්නද ඒ සඳහා සාර්ථක ප්‍රතිඵල මෙතෙක් ලැබී නොමැත.

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2019.11.28 දින සිට පුරප්පාඩුව පවතින අතර දැනට නිපුණතා සංවර්ධන , රැකීරක්ෂා සහ කම්කරු සබඳතා අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු වැඩ බැලීම සඳහා පත් කර ඇත.

දැනට පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකාපරිපාලන සේවයේ **1** වන ශ්‍රේණියේ තනතුරු ද්විත්වයෙන් එක් අධ්‍යක්ෂ තනතුරක් මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ අංශයට අයත් වන අතර අනෙක් තනතුර පාලන අංශයට අයත්වේ. මින් මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂන අංශය මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති විෂයන් අතරින් ප්‍රධානම අරමුණු 03ක් සාක්ෂාත් කර ගැනීම සඳහා පිහිටුවන ලද්දකි. ඒ අනුව ජාතික මිනිස්බල සහ රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස් කර ඉදිරිපත් කිරීම, ශ්‍රම වෙළඳපොළ තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදාහැරීම හා රැකියා පියස මගින් සිදු කරන සේවාවන් මෙම අංශය මගින් මෙහෙය වනු ලබයි. ඒ අනුව මෙම අංශය සඳහා සහකාර අධයක්ෂ තනතුරු 03 ක් අනුමත කර ඇතත් දැනට සේවය කරනු ලබන්නනේ එක් සහකාර අධයක්ෂ වරයකු පමණි. එම නිලධාරියා මගින් අංශය විසින් සිදු කර ගත යුතු සියළුම කාර්යයන් සිදු කර ගැනීමට සිදු වී ඇත.

පාලන අංශය සඳහා පමණක් කම්කරු දෙපාර්තමේන්තුවේ නිත්‍යව සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ **1** වන ශ්‍රේණියේ නිලධාරිනියක වැඩ බැලීම සඳහා පත් කර ඇතත්, පාලන අංශය

සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහකාර අධ්‍යක්ෂ වරයකුද, නොමැතිව එම අංශයේ වැඩ කටයුතුද සිදු කර ගැනීම අපහසුය.

නිත්‍යව සේවය කළ හැකි නිලධාරින් නොමැති වීම තුල වැඩ බැලීම සඳහා පත් කර ඇති නිලධාරින් මගින් අවශ්‍ය අත්‍යාවශ්‍ය සේවාවන් ඉටු කර ගැනීම විනා සැලසුම් සහගත ලෙස දෙපාර්තමේන්තුවේඉදිරි ගමන සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රමවේද සකස් කර ගැනීමේ ගැටළුකාරී තත්වයකට දෙපාර්තමේන්තුව මුහුණ දී ඇත. නිත්‍යව සේවය කරනු ලබන නිලධාරීන් මගින් වුවද උග්‍ර නිලධාරී හිඟය හේතුවෙන් එදිනෙදා අවශ්‍යතාවන් සපුරා ගැනීම හැර සැලසුම් සහගතව දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන් මඟ සඳහා අවශ්‍ය කාර්යයන් සපුරා ගැනීමේ දුෂ්කරතාවයකට දෙපාර්තමේන්තුව මුහුණ දී තිබේ.

දැනට පවතින ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා රාජකාරී ආවරණයට හෝ පත් කිරීමට නිලධාරීන් නොමැති බව පෙන්වා දෙනු ලබන අතර දෙපාර්තමේන්තුව සතුව සිටින ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහකාර අධ්‍යක්ෂවරියන් දෙදෙනා ද අංශ දෙකක රාජකාරීන් ආවරණය කරනු ලැබේ.

**A** ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන අප දෙපාර්තමේන්තුව සඳහා ද අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ඇති නමුත් අභ්‍යන්තර විගණකවරයෙක් ඒ සඳහා පත් කර නොමැති බැවින් එම අංශය දෙපාර්තමෙන්තුවේ ක්‍රියාත්මක නොවන අංශයක් බවට පත්ව ඇති බවද කාරුණිකව පෙන්වා දෙනු කැමැත්තෙමි.එම අංශයට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරියකු පමණක් අනුයුක්ත කර ඇති අතර, එමගින් , අපේක්ෂිත අරමුණු සාර්ථකව ඉටුකරගත නොහැකි බවද වැඩිදුරටත් සඳහන් කරමි. ඒ අනුව ගිණුම් අංශයේ ගණකාධිකාරී තනතුරෙහි රාජකාරී සඳහා හා අභ්‍යන්තර විගනණ අංශයේ රාජකාරීන් සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ **II** හෝ **III** ශ්‍රේණියේ නිලධාරියකු පත් කර දෙන මෙන් ඉල්ලීම් කර ඇතත් ඒ සඳහා ද මේ වනතෙක් සාර්ථක ප්‍රතිඵල ලැබී නොමැත.

තෘතීයික සේවාවේ තනතුරු ලෙස දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර ඇති පරිපාලන නිලධාරී , භාෂා පරිවර්තක, තොරතුරු තාක්ෂණ නිලධාරී සහ සංඛ්‍යා ලේඛන නිලධාරී යන තනතුරු සියල්ලම මේ වන විට පුරප්පාඩුව පවතී.

ද්විතියික ශ්‍රේණියේ තනතුරු අතරින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ පුරප්පාඩු ත්‍රිත්වයක් පවතින අතර සංවර්ධන නිලධාරී සේවයේද පුරප්පාඩු පවතී. එමෙන් ප්‍රාථමික ශ්‍රේණියේද පුරප්පාඩු 02 ක් 2019.12.31 වන දිනට දෙපාර්තමේන්තුව සතුව පවතී.

මෙම පුරප්පාඩු වලින් මාණ්ඩලික ශ්‍රේණියේ පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම මත දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන් මඟ සඳහා එය විශාල බාධවක් වී ඇති බව පෙන්වා දෙමි.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs.'000) | | වැඩසටහන් ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ආයතන සංග්‍රහයේ විධි විධාන හා පටිපාටික රීති භාවිතය | 02 | 2019.01.24 & 25 | 17 | - | දේශීය | ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටි රීති පිළිබඳ හැදින්වීම |
| පුද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙන යාම | 03 | 2019.01.28 & 29 | 25.5 | - | දේශීය | පුද්ගලික ලිපිගොනු පවත්වාගෙන යන ආකාරය, ගොනුවට ඇතුලත් කළ යුතු ලිපි පිළිබඳ දැනුවත් වීම |
| ජනපතිට කියන්න වැඩසටහනට අදාළ දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 35 | 2019.02.11 | 35 | - | දේශීය | දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ |
| Career Key පුහුණු වැඩමුළුව | 23 | 2019.03.09 | 15.85 | - | දේශීය | වෘත්තීය යතුර පරීක්ෂණය ක්‍රියාත්මක කරන ආකාරය |
| රජයේ නිලධාරීන්ගේ නිවාඩු විධිවිධාන පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුව | 01 | 2019.03.11 &2019.03.12 | 8.5 | - | දේශීය | නිවාඩු විෂය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය, චක්‍රලේඛ,විධිවිධාන පිළිබඳ දැනුවත් වීම |
| ප්‍රගති ඇගයුම් ඒකකය භාවිත කරන ආකෘති පත්‍ර සමාලෝචනය පිළිබඳ වැඩසටහන | 35 | 2019.03.11 | 13.65 | - | දේශීය | කරන ආකෘති පත්‍ර පිළිබඳව හා ඒවායේ භාවිත |
| Advance Excel පිළිබඳ පුහුණු වැඩමුළුව | 02 | 2019.05.02 , 08 &15 | 30 | - | දේශීය | Excel භාවිතය තුලින් රාජකාරී කටයුතු පහසුකර ගැනීම |
| ICT for Management Assistant | 01 | 2019.06.03 &04 | 13 | - | දේශීය | පරිගණකය භාවිතය පිළිබඳ හැඳින්වීම, Ms office, Internet & Email පිළිබඳ මූලික දැනුම |
| රාජ්‍ය ආයතන තුල විනය කළමණාකරණය | 03 | 2019.08.05,06 &07 | 36 | - | දේශීය | රාජ්‍ය ආයතන තුල විනට කළමණාකරනය හා ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් වීම |
| Project Proposals පිළිබඳ පුහුණු වැඩමුළුව | 02 | 2019.08.20 &21 | 14 | - | දේශීය | ව්‍යාපෘති යෝජනා වල වැදගත්කම , විවිධ ආකෘතීන් හා සැලැස්ම පිළිබඳ |
| Office System | 03 | 2019.08.22 &23 | 36 | - | දේශීය | කාර්යාල ක්‍රම පිළිබඳ මූලික හැඳින්වීම හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුලින් නිසි අවබෝධයක් ලබා ගැනීම |
| Clerical Skills පිළිබඳ පුහුණු වැඩමුළුව | 08 | 2019.09.16,17 &18 | 120 | - | දේශීය | නවක නිලධාරීන් ලෙස රාජ්‍ය අංශයේ කාර්යන් පිළිබඳ මූලික දැනුමක් ලබා දීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ගිණුම්කරණ ප්‍රමිත | 03 | දින 08 | 54 | - | දේශීය | රාජ්‍ය අංශයේ නව ගිණුම් කරන ප්‍රමිත අංක 10 සිට 20 දක්වා වන ප්‍රමිත පිළිබඳ හැඳින්වීම හා එහි භාවිතයන් |
| Project Proposals පිළිබඳ පුහුණු වැඩමුළුව | 04 | 2019.10.16,17 &18 | 72 | - | දේශීය | ව්‍යාපෘති යෝජනා වල වැදගත්කම , විවිධ ආකෘතීන් හා සැලැස්ම පිළිබඳ |
| Career Guidance - UK exposure visit - England | 01 | 2019.03.10 - 2019.03.14 | 28.89 | - | විදේශීය | About UK Career guidance system |
| ITEC - Training of Trainers in Entrepreneurship and Skills Development (TOT-ESD) - India | 01 | 2019.01.23 - 2019.03.19 | 215.76 | - | විදේශීය | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ සංවර්ධනය සඳහා වන ක්‍රියා පටිපාටිය |
| ITEC - Manpower Information System - India | 01 | 2019.01.21 - 2019.03.01 | 215.76 | - | විදේශීය | Manpower Information System මෘදුකාංගය හා එහි භාවිතය පිළිබඳ |
| Acadamy on Employment - Italy | 02 | 2019.05.04- 2019.05.18 | 429 | - | විදේශීය | |
| NILS - Capacity Building Training (Certificate Program) for Development PartnersChina | 01 | 2019.06.12- 2019.06.25 | 611 | - | විදේශීය | About Hr training, E-commerce development & major power strategy of china |
| Addressing the Challenges of youth NEET" - instruments and responses for labour market inclusion - Italy | 01 | 2019.09.14 - 2019.09.22 | 72.5 | - | විදේශීය | About youth neets engagement in labour market |
| Policy Consultation Programme Conducted by KEIS - Korea | 01 | 2019.09.22- 2019.09.28 | 360 | - | විදේශීය | About Public Employment service programmes,(work NET, HRD NET,Employment relations program & Career Guidance Programmes) |

## 6.4 ආයතනයේ කාර්ය සාධනය සඳහා පුහුණු වැඩසටහන්හි දායකත්වය

2019 වර්ෂය සඳහා අප විසින් දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා දේශීය හා විදේශීය පුහුණු අවස්ථා ලබා දී ඇති අතර ඒ තුලින් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉතා ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරන ලදී.

ඒ අනුව ආයතන හා ගිණුම් අංශයේ සේවයේ නියුතු රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධාන හා පටිපාටික රීති භාවිතය, පුද්ගලික ලිපිගොණු පවත්වාගෙන යාම , රජයේ නිලධාරීන්ගේ නිවාඩු , ICT for Management Assistant , රාජ්‍ය ආයතන තුළ විනය කළමනාකරණය, Office System , Clerical Skills ,ගිණුම්කරණ ප්‍රමිත, Advance Excel යන පුහුණු වැඩසටහන් ලබා දුන් අතර ඒ හරහා නිලධාරීන්ගේ දැනුම ප්‍රවර්ධනය සහ කාර්යක්ෂමතාවය වැඩිකිරීම සිදු කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ ,දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතුක්ෂේත්‍ර නිලධාරීන් සඳහා Carrer Key , ජනපතිට කියන්න වැඩසටහනට අදාල දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණු වැඩමුළු, ප්‍රගති ඇගයුම් සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර සමාලෝචනය, Project Proposal, යන දේශීය පුහුණු ද ,ITEC - Training of Trainers in Entrepreneurship and Skills Development (TOT-ESD)– India,ITEC - Manpower Information System - India,Addressing the Challenges of youth NEET" - instruments and responses for labour market inclusion – Italy,Policy Consultation Programme Conducted by KEIS – Korea යන විදේශීය පුහුණු අවස්ථා අප විසින් ලබා දුන් අතර ඒ තුලින් වඩා විධිමත් සහ කාර්යක්ෂම සේවාවක් මහජනතාවට ලබා දීම අපගේ අරමුණ විය.

මෙයට අමතරව දෙපාර්තමේන්තුවේ නිත්‍යව සේවය කළ මාණ්ඩලික නිලධාරීන් සඳහා National Framework for Higher education and Technical Training – England, Acadamy on Employment – Italy ,NILS - Capacity Building Training (Certificate Program) for Development PartnersChina යන පුහුණු වැඩසටහන් අප විසින් ලබා දී ඇති අතර ඒ තුලින් දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය නිවැරදි දැක්මක් මෙම නිලධාරීන් තුලින් ලබා ගැනීම අපේක්ෂා කරන ලදී.

මෙසේ දෙපාර්තමේන්තුවේ අභිවෘද්ධිය සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මිලියන 02 ක පමණ පිරිවැයක් දරමින් අප විසින් පුහුණු කරනු ලැබ ඇති අතර ඒ තුලින් කාර්යක්ෂම මහජන සේවයක් ලබා දීම අපගේ අරමුණ විය.

# පරිච්ඡේදය 07

# අනුකූලතා වාර්තාව

## 07.පරිච්ඡේදය- අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතාතත්ත්වය (අනුකූලවේ /අනුකූලනොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනිමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මුල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මුල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්(වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නැත | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නැත | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නැත | | |
| 1.6 | වෙනත් | අදාල නැත | | |
| **2** | **පොත්පත් හා ලේඛණ නඩත්තු කිරිම (මුරෙ445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛණ /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS)පිළියෙල කර නියමිතදිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත්කිරිම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙනයාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛණය යාවත්කාලින කරපවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානිපාඩු ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛණය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛණය (GA-N20)යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මුල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරිම (මුරෙ135)** | | | |
| 3.1 | මුල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 17/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD)නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ 134(2) DMA/-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමණාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4 ක් වත් අදාල වර්ෂය තුල පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමණාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පර්චිඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මුරෙ 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග්පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යෑම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මුරෙ 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016-12-29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේකයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනයවීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදුවාහන ලොග්පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කරතිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මුරෙ 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එලඹීම | අනුකූල නොවේ | අවශ්‍ය ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් ලබාදුන් සීමිත ප්‍රතිපාදනඉක්ම වා අත්‍යාවශ්‍ය වියදම් දැරීමට සිදුවීම | අත්‍යාවශ්‍ය වියදම් සඳහා ඉල්ලුම් කරන ප්‍රතිපාදන ලබාදීම |
| **12** | **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණයශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිටිණය ශේෂ නිරවුල්කර තිබීම | අනුකූල වේ | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මුරෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල්පොතේශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මුරෙ 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මුරෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදිතත් කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාල රෙගුලාසි වලට අනුකූලව රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අදාල නොවේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායම<br>ට බැරකර තිබීම | අදාල නොවේ | | |
| 15.3 | මුරෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **16** | මානව සම්පත් කළමනාකරණය | | | |
| | අනුමත කාර්යමණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම.** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරිමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය | අනුකූල නොවේ | සමස්ත කාර්ය | දිස්ත්‍රික් සම්බන්ධීකරණ |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | | මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීමේදි දිවයින පුරා සිටින නිලධාරින් ප්‍රධාන කාර්යාලයට ගෙන්වීමේදි ඇතිවූ අපහසුතා මත 2019 වර්ෂයේදි එය ක්‍රියාත්මක කළ නොහැකි විය. | නිලධාරීන් හරහා ගිවිසුම් අත්සන් කරවා ගැනීමේ ආකෘති පත්‍ර යොමු කිරීම. |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම. | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

# ඇමුණුම

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ඊඩබ්/ඒ/මි.ර.දෙ/2/2019/01 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 ජුනි 26 දින

අධ්‍යක්ෂ ජනරාල්,

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව.

**මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(අ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හා 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පරිදි මුදල් රෙගුලාසි 208 ප්‍රකාරව දෙපාර්තමේන්තු ශීර්ෂය වෙත වෙනත් ශීර්ෂ මගින් හර කරනු ලබන වියදම් ඇතුලත් නොකල යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී වෙනත් ශීර්ෂ මගින් දරන ලද පුද්ගලික

පඩිනඩි හා වෙනත් මෙහෙයුම් වියදම් රු.18,652,183 ක් හා ප්‍රාග්ධන වියදම් රු.9,450,644 ක් ඇතුලත් කිරීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය සහ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය පිළිවෙලින් එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් නිරූපණය කර තිබුණි.

(ආ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීමේදී අංක 32801 දරන අත්තිකාරම් 'බී' ගිණුමට අදාලව භාණ්ඩාගාරයේ සටහන්වලට අනුව හර හා බැර සැලකිල්ලට ගතයුතු වුවද එලෙස කටයුතු නොකිරීම නිසා වර්ෂයේ හර (ගෙවීම්) රු.963,361 ක් වැඩියෙන්ද වර්ෂයේ බැර (ලැබීම්) රු.699,637 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඇ) 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හි 7 (vi) ඡේදය අනුව 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ 2019 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය ගැලපීම සඳහා අක්මුදල් ගැලපුම් ගිණුම පිළියෙල කළයුතු වුවද දෙපාර්තමේන්තු විසින් අක්මුදල් ගැලපුම් ගිණුම පිළියෙල කිරීමේදී දෙපාර්තමේන්තු ගිණුම්වලට කරන ලද හර සටහන් හා බැර සටහන් ද ඇතුළත් කර වසර අවසානයේ භාණ්ඩාගාරයට පියවිය යුතු ශේෂය නිරූපණය කරන ලෙස සකස් කර තිබුණි. මේ අනුව ඇමුණුම 01 මගින් විගණනයට ඉදිරිපත් කර තිබූ අක්මුදල් ගැලපුම් ගිණුම චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.

(ඈ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හා 2019/12/03 දිනැති චක්‍රලේඛයට අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ වත්කම් හා ප්‍රාග්ධනය යටතේ ඇති ශුද්ධ වත්කම් ලබාගනුයේ දෙපාර්තමේන්තුව සතු අත්තිකාරම් ගිණුම් වටිනාකම්වලින් තැන්පත් ගිණුම්වල වටිනාකම අඩු කිරීමෙනි. ඒ අනුව ශුද්ධ වත්කම්වල වටිනාකම රු.39,268,764 ක් වුවද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ වත්කම් ලෙස රු.39,010,682 ක් ලෙස රු.258,082 ක් අඩුවෙන් නිරූපණය කර තිබුණි. එමෙන්ම රු.258,082ක් වූ මුදල් හා මුදල් සමාන දෑ (ACA-3) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි

### 1.6.2 දේපල පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව (ACA-6) වර්ෂය තුල ස්ථාවර වත්කම් මිලදී ගැනීම්වල වටිනාකම රු.4,493,462 ක් ලෙස දක්වා තිබුණද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම්වල වටිනාකම රු.796,130 ක්

වූයෙන් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අතර මූලධන වත්කම් අත්පත් කර ගැනීම්වල රු.3,697,332 ක වෙනසක් නිරීක්ෂණය විය. වෙනස්කම් සඳහා සාක්ෂි විගණනයට අනාවරණය නොවුනි.

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කිරීමේදී රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ( ACA 6) දත්තයන් අදාල කරගත යුතු වේ. ACA 6 ආකෘතිය අනුව ආරම්භක ශේෂය රු.73,938,806 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව දේපල, පිරියත හා උපකරණවල ඉකුත් වර්ෂය අවසානයේ වටිනාකම රු.70,978,466 ක් වී තිබුණි. මේ අනුව එම ප්‍රකාශ දෙක අතර දේපල හා පිරියත උපකරණවල ආරම්භක ශේෂය අතර රු.2,960,340 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

දෙපාර්තමේන්තුව වෙනුවෙන් විසර්ජන පනත මගින් වෙන් කරන ලද මූලධන ප්‍රතිපාදනය රු.35,000,000 ක් වූ අතර ඉන් රු.9,566,117 ක ප්‍රතිපාදන ඉතිරියක් පැවති අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 27 ක් විය. මෙම වෙනසට හේතුව අයවැය දෙපාර්තමේන්තුව මගින් නිකුත් කල චක්‍රලේඛවලට අනුව ඉතිරි කල බව ලෙස දක්වා තිබුණද වැය විෂයන් 6 ක ඉතිරිවීම රු.7,435,441 ක් වූ අතර එය සියයට 40 සිට සියයට 93 දක්වා වූ පරාසයක විය. එම ඉතිරිවීම් සඳහා හේතු දක්වා නොතිබුණි.

### 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| i. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (අ) සහ (ආ) වගන්ති | ලිපිද්‍රව්‍ය, වාර සඟරා සහ ප්‍රකාශන වැනි විශේෂ වර්ගවල භාණ්ඩ හා සේවා සැපයීමට හැකි සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගත යුතු වුවද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක්වන ප්‍රකාශන නිකුත් කිරීම සඳහා එසේ සැපයුම්කරුවන් ලියාපදිංචි කරගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශන නිකුත් කිරීම සඳහා රු.3,269,150 ක් වැයකර තිබුණි. |
| ii. 1994 අප්‍රේල් 20 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94 හි 5.2.3 ඡේදය | ජාත්‍යන්තර කම්කරු සංවිධානය මගින් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ රු.2,885,200 ක් වටිනා උපකරණවල හිමිකම දෙපාර්තමේන්තුව වෙත පවරා දී තිබුණද චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන පරිදි ඒවා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

මු.රෙ. 371 (5) ප්‍රකාරව සියලුම අතුරු අග්‍රිම අදාල වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පියවිය යුතු වුවද 2019 දෙසැම්බර් 31 දිනට නොපියවන ලද අග්‍රිම ශේෂය රු.258,083 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

ටී.ජී.අයි.පද්මිණී,
සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට